# රණවිරුවා

2020 ජනවාරි • 213 කලාපය



## 4 ඩිප්ඨානයෝ හීතව රමුත්‍ය කරා

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# අතීත විරුවන්ගේ අභිමන් සෙවණක පියසටහන්...




















"ජනාධිපති රණ පරශුව සහ රෙජිමේන්තු රණ පරශුව" යන සම්මානයෙන් පිදුම්ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායේ 23 වන සංවත්සර දිනය ඉකුත් ජනවාරි 17 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් නාවුල පිහිටි එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අභිමානවත් සමරුම් උත්සවයක් පැවැත්වූයේ වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන, යුද්ධ හමුදාධිපති මෙන්ම විශේෂ බලකා රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙනි. එහිදී "ජනාධිපති රණ පරශුව සහ රෙජිමේන්තු රණ පරශුව" පෙරටු කරගත් වර්ණවත් සම්මාන ආචාර පෙළපාලියකින් පිදුම් ලැබූ රෙජිමේන්තු අධිපතිතුමන් මව්බිම වෙනුවෙන් දිවිපිදූ අභීත විශේෂ බලකා රණවිරුවන්ට පුෂ්පෝපහාර දැක්වීමටද අමතක නොකළේය.





# ශ්‍රී ලංකා යුද්ධ හමුදා පැරා ක්‍රීඩා උළෙල - 2019




යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් රණවිරුවන් 700 කගේ පමණ සහභාගීත්වයෙන් පැවති 22 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා "පැරා ක්‍රීඩා උළෙල" 2019 දෙසැම්බර් 29 දින සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. රෝද පුටු පැසි පන්දු, බැඩ්මින්ටන්, බයිසිකල් පැදීම, රෝද පුටු මැරතන්, දුනු විදීම, බර ඉසිලීම, අත් පන්දු, ආසන මත සිට කෙරෙන අත් පන්දු ක්‍රීඩාව, වෙරළ අත් පන්දු, මේස පන්දු, ක්‍රිකට්, පිහිනුම්, රෝද පුටු මේස පන්දු, වායු රයිෆල් වෙඩි තැබීම් සහ මලල ක්‍රීඩා වැනි විවිධ තරඟ ඉසව් රැසකින් මෙවර පැරා ක්‍රීඩා උළෙල සමන්විත විය. ක්‍රියාන්විත සේවාවන්හි නියැලී සිටියදී විවිධ ආබාධයන්ට ලක්වූ රණවිරුවන් සතු ක්‍රීඩා කෞශල්‍ය ඔප්නංවමින් ඔවුන්ව ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම තුළ ඔසවා තැබීම මෙම ක්‍රීඩා තරඟාවලියේ අරමුණ වේ.




යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනාවකට අනුව ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කේ. ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා මෙම තරඟාවලියේ සමාප්ති උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය.




ශ්‍රී ලංකා පාබල හමුදාවේ අභීත සෙබලුන් මෙවර තරඟාවලියේ සමස්ත ශූරතාවය දිනාගත් අතර, ගජබා රෙජිමේන්තුව සහ විජයබාහු පාබල රෙජිමේන්තු පිළිවෙලින් අනුශූරතාව සහ තෙවන ස්ථාන දිනාගත්හ. ඩයලොග් ආසියාටා සමාගම විසින් අනුග්‍රාහකත්වය දැක්වූ මෙවර තරඟාවලියේදී වසරේ හොඳම මලල ක්‍රීඩකයාට හිමි කුසලානය කමාන්ඩෝ රෙජිමේන්තුවේ සැරයන් සීඑන්බී ඉන්ද්‍රපාලට හිමිවූ අතර, තරඟාවලියේ හොඳම මලල ක්‍රීඩකයාට හිමි කුසලානය
ශ්‍රී ලංකා පාබල හමුදාවේ කෝප්‍රල් ධනංජය එම්වීටී හිමිකර ගත්තේය.

# තුරු මිතුරු නව රටක්...

රජය විසින් ක්‍රියාත්මක කරන "සෞභාග්‍යයේ දැක්ම" නම් ප්‍රතිපත්තියට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සංකල්පයක් මත බිහිවූ "තුරු මිතුරු නව රටක්" වනාන්තර සහ නගර අලංකරණ ව්‍යාපෘතිය 2019 දෙසැම්බර් 23 දින ආරම්භ කෙරිණ. එහිදී බත්තරමුල්ල ප්‍රදේශයේ පිහිටි මධ්‍යම පරිසර අධිකාරි මංසන්ධියේ සිට ශ්‍රී ජයවර්ධනපුර නව යුද්ධ හමුදා මූලස්ථානය දක්වා දිවෙන ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය දෙපස අරලිය පැළ රෝපණය කරමින් ව්‍යාපෘතිය ආරම්භ විය. එයට නව අරුතක් හා නව මානයක් දෙමින් යුද්ධ හමුදාධිපතිගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයට අයත් අක්කර 12 ක පුරන් වූ කුඹුරු රණවිරු දෑතින් පෝෂණය වූයේ ව්‍යාපෘතියේ දෙවන අදියර වශයෙනි. එදිනද යුද්ධ හමුදා මූලස්ථානය වෙත දිවෙන මාර්ගයේ කරඳ, මී, කොබෝනීල ආදී දුර්ලභ ඝනයේ පැළ 140 ක් රෝපණය කරන ලදී. මෙම දෙවන අදියරේ සමාරම්භයට සමගාමීව සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන මට්ටමින් පුරන් කෙත් අස්වැද්දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමටත් එහි කොටසක් ලෙස කාබනික පොහොර පමණක් භාවිතා කර එළවළු වගාකිරීමටත් කටයුතු කිරීම විශේෂත්වයකි.







# නැණ ගුණ පිරි විරු දරු අභිමන් - 2019...



## ස්වේච්ඡා බළසේනා අධ්‍යාපන මූල්‍යාධාර ප්‍රදානෝත්සවය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාව මගින් සංවිධානය කළ "නැණ ගුණ පිරි විරු දරු අභිමන් - 2019" ඉකුත් ජනවාරි 06 දින කොළඹ 07 නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේදී පැවැත්විණ. ස්වේච්ඡා බළසේනාව වසරක් තුළ සංවිධානය කරන දැවැන්තම සුබසාධන ව්‍යාපෘතිය වූ මෙමගින් ස්වේච්ඡා බළසේනාවට අයත් රණවිරු පවුල්වල පාසල් සිසු සිසුවියන් 1511 දෙනෙකු සඳහා මූල්‍යාධාර, ශිෂ්‍යත්ව, අධ්‍යාපන දිරිගැන්වීම්, අගය කිරීමේ පදක්කම් සහ ආධාර ප්‍රදානය කිරීම සිදුවිය. එසේම යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සංකල්පයක් මත මෙම මූල්‍යාධාර ප්‍රදානය නව දැක්මක් ඔස්සේ සිදුකරමින් මෙතෙක් ස්වේච්ඡා බළසේනා රණවිරු දූ දරුවන්ට පමණක් සීමාවී තිබූ අධ්‍යාපන මූල්‍යාධාර ලබාදීම ප්‍රථම වරට නිත්‍ය බළසේනාවේ රණවිරු දූ දරුවන්ටද හිමිගැන්වීම විශේෂත්වයකි.



පාසල් දරුදැරියන්, දෙමව්පියන්, ආරාධිත අමුත්තන් විශාල පිරිසක් මධ්‍යයේ අතිශය විචිත්‍රවත්ව සංවිධානය කොට තිබූ මෙම අධ්‍යාපනික සත්කාරයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.



මෙම මූල්‍යාධාර ප්‍රදානෝත්සවයට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය සුජීවා නෙල්සන් මහත්මිය, යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, සාගරා ගුණවර්ධන මහත්මිය, ස්වේච්ඡා බළසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක බ්‍රිගේඩියර් කේපී නුගේගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී, ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ සභාපති සහ ඩීඑෆ්සීසී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු විශාල පිරිසක් ද එක්වූහ.



> " රුපියල් මිලියන 46 ක් පමණ වන අති දැවැන්ත මුදලක් මෙම සුබසාධන ව්‍යාපෘතිය හරහා පිරිනමන ලද අතර, එය විශ්ව විද්‍යාල ප්‍රවේශයලත්, අපොස (සා/පෙළ) විභාගය සමත් හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සමත් දූ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම උදෙසා යෙදවේ "

# කොතලාවලින් තවත් විද්‍යාර්ථීන් පිරිසක්

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2019 උපාධි ප්‍රදානෝත්සවය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පසුගියදා පැවැත්විණ. එහිදී විද්‍යාර්ථීන් 1282 දෙනෙකු උපාධි හිමිකරගන්නා ලදී. ඒ අතර දර්ශනපති උපාධිලාභියෙකු ඇතුලු පශ්චාත් සහ විද්‍යාපති උපාධිධාරීහු 224 දෙනෙකු ද වූහ. මෙම අවස්ථාවට ආරක්ෂක ලේකම්, ත්‍රිවිධ හමුදාධිපතිවරු ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද සහභාගී වූහ.





"ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය 1981 වසරේදී අංක 61 දරන පාර්ලිමේන්තු පනත මගින් උසස් දැනුමෙන් යුතු ත්‍රිවිධ හමුදා නිලධාරීන් බිහිකිරීමේ අරමුණින් ඇරඹිණ. 2009 වර්ෂයේදී එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මෙය පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්කළේය. වෛද්‍ය පීඨය පිහිටුවීම, සාමාන්‍ය හා විදෙස් කැඩෙට් සිසුන් ඇතුළත් කරගැනීම, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන අවස්ථා හඳුන්වාදීම, දක්ෂිණ විශ්වවිද්‍යාලය සූරියවැව පිහිටුවීම මෙන්ම අති නවීන රෝහලක් ආරම්භ කිරීමද මෙම කාලයේදී සිදුකෙරිණ."

# අමරණීය යතිවරයාණෝ...

වර්ෂ 1995 මැයි 26 දින එල්. ටී. ටී.ඊ ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරන ලද සුප්‍රසිද්ධ යතිවරයාණන් වහන්සේ නමක් වූ පූජ්‍ය දිඹුලාගල සීලාලංකාර නායක හිමිපාණන් වහන්සේ සිහිවීම පිණිස ඉදිකරනු ලැබූ ප්‍රතිමාවක් ඉකුත් ජනවාරි 08 දින නිරාවරණය කෙරිණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස බෞද්ධ භික්ෂු සහෝදරත්වයේ සාමාජිකයෙකු වන වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය. පොළොන්නරුව මඩකලපු හංදියේදී ඉදිකරන ලද එම අපවත්වී වදාළ දිඹුලාගල නායක ස්වාමීන් වහන්සේගේ රන් පැහැති ප්‍රතිමාව සහ එහි සමරු ඵලකය සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ යුද්ධ හමුදාධිපතිතුමන් ගේ සුරතින් නිරාවරණය කරනු ලබීය.

එවක ත්‍රස්තවාදී තර්ජන නොතකා ප්‍රදේශයේ ජනතාව නැවත පදිංචි කරවමින් එහි කෘෂිකර්මාන්තය දියුණු කොට ඔවුනගේ ජීවන තත්වය නංවාලීම සඳහා පුරෝගාමී මෙහෙවරක නිරත යතිවරයාණන් වහන්සේ නමක් වූ අපවත්වී වදාළ දිඹුලාගල නාහිමිපාණන්ගේ නාමය ඉතිහාසයට එක්වී ඇත්තේ අදටද එම ප්‍රදේශයේ ජනතාව තුළ මෙන්ම සමස්ත ජාතියේම ඉමහත් ගෞරවයට පාත්‍ර වෙමිනි.





# 8 වන ෆුලර්ටන් සමුළුවට යුද්ධ හමුදාධිපති එක්වෙයි...






8 වන ජාත්‍යන්තර උපායමාර්ගික අධ්‍යයන ආයතනයේ ෆුලර්ටන් සමුළුව "ෂැන්ග්‍රි-ලා සංවාද ෂෙර්පා හමුව" ඉකුත් ජනවාරි 20 සිට 22 දින දක්වා සිංගප්පූරුවේදී පැවැත්විණ. ඒ සඳහා රටවල් 25 කට අධික ප්‍රමාණයක ආරක්ෂක නිලධාරීන්, පර්යේෂණ විශ්ලේෂකයින් සහ රාජ්‍ය නොවන විශේෂඥයින් සියදෙනෙකුට වැඩි පිරිසක් සහභාගී වූහ. එහිදී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඊට වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහ නාවික හමුදාධිපති වයිස් අද්මිරාල් කේකේවීපීඑච් ද සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ඇන්ඩ් බාර් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ සහභාගී වූහ. කලාපීය ආරක්ෂාව, සුපරික්ෂාකාරීබව සහ ස්ථාවරත්වය සහතික කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ සාකච්ඡා කිරීම මෙම සමුළුවේ අරමුණ විය.



# ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය යුද්ධ හමුදාධිපති හමුවේ



බාලදක්ෂ සංගමය සඳහා මෙතෙක් අඛණ්ඩව ලබාදුන් සහයෝගය වෙනුවෙන් යුද්ධ හමුදාව වෙත ගෞරව පුද කිරීම වස් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත සංකේතාත්මක විශේෂ, දුර්ලභ පදක්කම් දෙකක් ප්‍රදානය කිරීම 2019 දෙසැම්බර් 30 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ. ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සම්බන්ධීකරණයෙන් හෝමාගම දිස්ත්‍රික් බාලදක්ෂ සංගමයේ විධායක සභාපති සහ දිස්ත්‍රික් බාලදක්ෂ නායක එම අවස්ථාවට සහභාගි වූහ. එහිදී ගිල්වෙල් නැවත එක්වීම (Gilwell Reunion) (විශේෂ සීමිත සංස්කරණ) පදක්කම හා "හෝමාගම දිස්ත්‍රික් බාලදක්ෂ පදක්කම" එලෙස ප්‍රදානය කරනු ලැබූ පදක්කම් අතර විය.

# "සෙබල සිතුවම්" චිත්‍ර ප්‍රදර්ශනය එළිදක්වයි...





ශ්‍රී ලංකා සංඥා බළකායේ සෙබළ සෙබළියන්ගේ නිර්මාණාත්මක හැකියාවන් එළිදැක්වීමේ අරමුණින් "සෙබළ සිතුවම්" නමින් චිත්‍ර ප්‍රදර්ශනයක් ඉකුත් ජනවාරි 11, 12 දෙදින තුළ ජේ.ඩී.ඒ. පෙරේරා කලාගාරයේදී පැවැත්විණි. සංඥා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එන්එම් හෙට්ටිආරච්චි වීඑස්වී යූඑස්පී පීඑස්සී එච්ඩීඑම්සී ගේ සහ එම බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය කේෂාණි හෙට්ටිආරච්චි මහත්මියගේ අදහසක් හා මගපෙන්වීම මත ක්‍රියාත්මක වූ එම චිත්‍ර ප්‍රදර්ශනය සඳහා විවිධ තේමාවන් ඔස්සේ නිර්මාණය කළ සිතුවම් රැසක් ඇතුළත් විය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඇරඹි මෙම චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට විශාල පිරිසක් පැමිණියහ.

## යුද්ධ හමුදාධිපති වැඩබලන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන ලෙස රාජකාරී අරඹයි...

නව වැඩබලන ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජනවාරි 02 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන කාර්යාලයේදී වැඩ භාරගන්නා ලදී. ත්‍රිවිධ හමුදා ගෞරවාචාර මධ්‍යයේ ඓතිහාසික දිනයක සිදුකෙරුණු එම අභිමානවත් අවස්ථාවේ විචිත්‍ර මතක සටහන් මෙහි දැක්වේ.





# යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන "රණවිරු සෙවණෙහි සංචාරයක"



රණක්ෂිතයට පත්ව රාගම "රණවිරු සෙවණෙහි" නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් එස්ඩීටී ලියනගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඉකුත් ජනවාරි 29 දින එහි සංචාරයක නිරත විය. එහිදී ප්‍රතිකාර ලබන රණවිරුවන් සමග එදවස යුදබිමේ මතක ආවර්ජනය කරමින් සුහද පිළිසඳරක නිරත වූ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ඔවුන් වෙත ත්‍යාග පාර්සල් පිරිණැමීමටද කටයුතු කරන ලදී.

# පාබල මේලා මෙවරත් උත්කර්ශවත්ව...




අභීත පාබල විරුවන්ගේ සුබසාධනය උදෙසා අරමුදල් රැස් කිරීමේ අරමුණින් පවත්වන ලද "පාබල මේලා" දැවැන්ත වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය මෙවර හික්කඩුව මහජන ක්‍රීඩාංගණයේදී 2019 දෙසැම්බර් 27 හා 28 දෙදින පුරා අති උත්කර්ශවත් අයුරින් පැවැත්විණි. පාබල හමුදා රෙජිමේන්තු අධිපතිගේ පූර්ණ මගපෙන්වීමෙන් සංවිධානය කළ එම දැවැන්ත සැණකෙළියට සුනඛ සංදර්ශන, යුද්ධ හමුදා අංගම්පොර, තූර්ය වාදන සංදර්ශන, සන්නාහ සන්නද්ධ රථ, කාලතුවක්කු හා පාබල හමුදාවේ අවි ප්‍රදර්ශන ද ඇතුළත් විය. තවද මාරක ලිඳ, කතුරු ඔංචිල්ලා, මෙරිගෝ රවුම් ඇතුලු විනෝද ක්‍රීඩා රැසකින්ද එය සමන්විත විය.




සැණකෙළියේ ආරම්භක දින ප්‍රධාන ආරාධිතයා ලෙස විශ්‍රාමික මේජර් ජෙනරාල් ජේආර් කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී එක්වූ අතර, බටහිර ආරක්ෂක සේනා ආඥාපති හා පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්එල් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ අවසන් දින ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි විය. එහිදී රට වෙනුවෙන් තම කායදානය කැපකළ විරුවන් හත්දෙනෙකු වෙත හා සිවිල් සේවක මහතෙකු වෙත නිවාස ඉදිකිරීම සඳහා ප්‍රේෂණ පත් ලබාදීමද සුබසාධන කටයුතු පුළුල් කිරීම සඳහා සේවා වනිතා ශාඛාව වෙත රුපියල් 5,000,000.00 ක මුදලක් ලබාදීමද එහිදී සිදුකෙරුණු කටයුතු අතර විශේෂ විය.








## කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව....





ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තුව යටතේ සේවය කරන සිවිල් සේවකයින් ඇගයීම වෙනුවෙන් වූ සුහද හමුවක් ඉකුත් ජනවාරි 02 දින 4 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ එම අවස්ථාවට එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිණී ලූද්මිලා ද සිල්වා ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස එක්වූවාය.

## ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව ....





ශ්‍රී ලංකා ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාව මගින් එම බළකායේ සේවය කරන ලද රණවිරුවන්ගේ දූවාදරුවන් 185 දෙනෙකු වෙනුවෙන් පොත් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2019 දෙසැම්බර් 25 දින පවත්වන ලදී. එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණි සාගරා ගුණවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු එම වැඩසටහන සඳහා මේනකා පතිරණ, ජේ.ජී.ජේ. ප්‍රසාද් කුමාර යන මහත්ම මහත්මීන් සහ නිත්‍යකල්යාණි ජුවලර්ස් වෙතින් අනුග්‍රහය දක්වන ලදී. එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ද එක්විය.

## සන්නද්ධ බුද්ධි බළකා සේවා වනිතා ශාඛාව....

රණක්ෂිතයට පත්ව අභිමංසල II කඹුරුපිටියෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා සන්නද්ධ බුද්ධි බළකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ 2019 නොවැම්බර් 29 දින එහි නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණි කුමාරි වඩුගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකළ එම නිරීක්ෂණ චාරිකාවේදී එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන් වෙත රුපියල් 2000 ක් පමණ වටිනා කාර්ගිල්ස් වවුචර්පත්ද ප්‍රදානය කරන ලදී. තවද එම රණවිරුවන් වෙත ප්‍රණීත දිවා භෝජන සංග්‍රහයක් ද ලබාදුන් අතර එම අවස්ථාවට නර්තන අංගයන්ගෙන් සපිරි සංගීත වැඩසටහනක්ද එක්කොට තිබිණ.



## පාබල හමුදා සේවා වනිතා ශාඛාව...





ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ක්‍රිෂානි මුදලිගේ මහත්මියගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ කාලීන ධර්ම දේශනාවක් 2019 නොවැම්බර් 08 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ හිටපු සභාපතිණියක් වන ධනංජනී කරුණාසේකර ඇතුළු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් ද එහි නියෝජ්‍ය මධ්‍යස්ථාන සේනාවිධායක, සෙසුනිලයින්, බිරින්දෑවරුන් ඇතුලු දහසකට ආසන්න පිරිසක් ඊට එක්වූහ. "සෙබලාගේ ගෘහ ජීවිතය හා රැකියාව නිසි ලෙස හඳුනාගෙන එය සාර්ථකව පවත්වාගෙන යාම" නමැති මාතෘකාව යටතේ පැවැත්වූ එම ධර්ම දේශනාව ශාස්ත්‍රපති අතිපූජ්‍ය මාවරලේ භද්දිය හිමි විසින් සිදුකළ සේක.

## සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...

සිංහ රෙජිමේන්තුවට අයත් නිලධාරින් සහ සෙසුනිලයින්ගේ දූවා දරුවන් වෙනුවෙන් සංවිධානය කළ "අනාගත නායකත්වය සඳහා දරුවන් සවිබල ගැන්වීම" නම් වූ නේවාසික වැඩමුළුවක් 2019 දෙසැම්බර් 28 දින සිට 30 දින දක්වා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. දූවා දරුවන් 49 දෙනෙකු සහභාගි වූ එම වැඩමුළුව ප්‍රවීන මනෝවිද්‍යා දේශක චන්දන ගුණවර්ධන මහතා විසින් මෙහෙයවනු ලැබීය. සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණි ප්‍රියමාලි මුදන්නායක මැතිණියගේ ප්‍රධානත්වයෙන් පැවති එහි සමාප්ති අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු ලේකම් පද්මිණි පල්ලාවල මහත්මිය ඇතුළු රෙජිමේන්තු මධ්‍යස්ථානයේ නිලධාරින් රැසක්ද සහභාගී වූහ. එහිදී වැඩසටහන සඳහා සහභාගී වූ දූවා දරුවන් වෙත සහතිකපත්ද පිරිනැමිණ.



## ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව...




ගැමුණු හේවා සේවා වනිතා ශාඛාවේ හිටපු ගරු සභාපතිණිය සුජීවා ජයසේකර මැතිණියගේ විශ්‍රාම යාමත් සමඟ නව සභාපතිණිය ලෙස හෂ්මරීන් බන්සජයා මැතිණිය 2019 ඔක්තෝම්බර් 18 දින වැඩ භාරගන්නා ලදී. එම අවස්ථාවට ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවෝ රැසක්ද සහභාගි වූහ.

## විශේෂ බළකා සේවා වනිතා ශාඛාව...



විශේෂ බළකා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහා සභා රැස්වීම ඉකුත් ජනවාරි 17 දින එහි සභාපතිණි හා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිණිය සුජීවා නෙල්සන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් නාඋල විශේෂ බළකා රෙජිමේන්තු මූලස්ථානයේදී පැවැත්විණි. එදින විධායක කමිටුවේ තනතුරු පත්කිරීම සිදුකෙරුණු අතර, එම අවස්ථාවට සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් 25 දෙනෙකුගෙන් යුත් පිරිසක් සහභාගී වූහ.



## විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු සේවා වනිතා ශාඛාව...

ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාවේ සභාපතිණිය ඇතුලු එහි සාමාජිකාවන් 2019 නොවැම්බර් 09 දින අභිමංසල III පාන්ගොල්ල හි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. එහිදී එම රණවිරුවන් උදෙසා ප්‍රණීත තේපැන් සංග්‍රහයක් පිරිණැමූ අතර, ඔවුන්ගේ විනෝදාස්වාදය පිණිස වූ වැඩසටහන් ද ක්‍රියාත්මක කෙරිණ. තවද එම රණවිරුවන් වෙත අත්‍යවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමටද එම සේවා වනිතා ශාඛාව ක්‍රියාකරන ලදී.





## ඉංග්‍රීසි දැනුම වැඩුමට පාඨමාලාවක්...



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩීයූ ගේ උපදෙස් මත එම බළ ප්‍රදේශයේ රාජකාරී නියුතු සෙසුනිලයින්ගේ ඉංග්‍රීසි දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහනක් අරඹන ලදී. 2019 නොවැම්බර් මස 25 දින සෙසුනිලයින් 21 දෙනෙකුගෙන් ආරම්භ කරන ලද එම පාඨමාලාව පසුගිය ජනවාරි 09 දින නිමාවට පත්විය. ආරක්ෂක සේනා මූලස්ථානයේ ඉංග්‍රීසි උපදේශක වශයෙන් රාජකාරී කරනු ලබන ලුතිනන් ජ්එල්ජ්එස්ඩී ලියනආරච්චි - ශ්‍රීලයූපොදුසේබ යන නිලධාරීනිය විසින් අදාළ පාඨමාලාව මෙහෙවන ලදී.

# පාපන්දු තරඟාවලියක්...






යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය, 51, 52, 55 සේනාංක මූලස්ථාන හා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) නියෝජනය වන පරිදි කණ්ඩායම් 10 ක සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු පාපන්දු තරඟාවලියක් 2019 දෙසැම්බර් 23 දින 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකා ක්‍රීඩා පිටියේදී පැවැත්විණ. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ අදහසකට අනුව 52 සේනාංකයේ අධීක්ෂණයෙන් 522 බළසේනාව මගින් එය සංවිධානය කරන ලදී.

තරඟාවලියේ අවසන් මහා තරඟය සඳහා යාපනය ආරක්ෂක සේනා මූලස්ථාන කණ්ඩායම සහ 51 සේනාංක කණ්ඩායම තේරී පත්වූ අතර, එහිදී තියුණු තරඟයකින් අනතුරුව තරඟාවලියේ ශූරතාවය දිනාගැනීමට ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) කණ්ඩායම සමත්වූහ. එහිදී තරඟාවලියේ හොඳම ගෝල් රකින්නා ලෙස 51 සේනාංක මූලස්ථාන කණ්ඩායමේ සැරයන් වීරසිංහ ඒපීජීඑස් සම්මාන හිමිකරගත් අතර, එහි දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ආරක්ෂක සේනා මූලස්ථාන කණ්ඩායමේ ලා/කෝ දුෂ්මන්ත එන්ජ්කේ විසින් හිමිකර ගන්නා ලදී. මෙම පාපන්දු තරඟාවලිය නැරඹීම සඳහා යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.

---

# නව වසරට අරුතක්...

යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය මගින් 2020 නව වසර උදාව නිමිත්තෙන් සංවිධානය කළ සත්කාරක වැඩසටහනක් යාපනය බළ ප්‍රදේශයේ තොල්පුරම් හි පිහිටි සිවහුම් වැඩිහිටි නිවාසයේදී ඉකුත් ජනවාරි 01 දින සිදුකරන ලදී. එහිදී එම නිවාසයේ නේවාසික වැඩිහිටියන් වෙනුවෙන් සංගීතමය වැඩසටහනක් පවත්වා ඔවුන් වෙත විශේෂ දිවා ආහාර වේලක්ද පිරිනමන ලදී. තවද ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) මගින් සමූපකාර වැඩිහිටි නිවාසය, 51 සේනාංකය වෙතින් මදර් තෙරේසා වැඩිහිටි නිවාසය, 52 සේනාංකය මගින් පුත්තූර් ශාන්ත ලූකස් වැඩිහිටි නිවාසය සහ 55 සේනාංකය මගින් පරමානන්ද ළමා හා වැඩිහිටි නිවාසය වෙතද විශේෂ ආහාර වේල බැගින් ලබාදීමට හා සංගීත වැඩසටහන් පැවැකටයුතු යොදා තිබුණි. යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරුණු මෙම මාහැඟි කටයුත්තට ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති ඇතුලු තවත් නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.





# සුහද හමුවක මතක සටහන්...





වව්නියාවේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ ආඥාපති ගුවන් කොමදෝරු එල්එච් සුමනවීර සහ පූනරින් පිහිටි නාවික හමුදා කඳවුරේ අණදෙන නිලධාරී කපිතාන් ආර්පීසීආර් ෆොන්සේකා ඉකුත් ජනවාරි 10 දින ආරක්‍ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී හමුවූහ. මෙම සුහද හමුව අතරතුරදී වන්නි ආරක්‍ෂක සේනා මූලස්ථානය යටතේ සේවයේ නියුතු භට පිරිස් සමග සම්බන්ධීකරණයෙන් යුතුව එම ප්‍රදේශයේ ආරක්‍ෂාව සහ සාමය පවත්වා ගැනීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අදහස් හුවමාරු කරගන්නා ලදී.







## නිවාඩු නිකේතනය රණවිරු අයිතියට...



ඕමන්ත ප්‍රදේශයේ පිහිටි 21 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සියලු නිලයින් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව නිවාඩු නිකේතනයක් 2019 දෙසැම්බර් 30 දින වන්නි ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඒඑම්ආර් ධර්මසිරි එන්ඩීයූ පීඑස්සී ගේ සුරතින් රණවිරුවන්ගේ අයිතියට පත්කරනු ලැබීය. 21 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජේඑම්ජේ පෙරේරාගේ මුලපිරීමක ප්‍රතිඵලයෙන් එම රෙජිමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකරනු ලැබූ මෙම නිවාඩු නිකේතනය මඟින් ඕමන්ත ප්‍රදේශය වෙත පැමිණෙන යුද්ධ හමුදා සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල අයවලුන් හට නවාතැන් ගැනීමේ පහසුකම් සැපයේ.

# දැනුම දිනුමට අත්වැලක්...





කිළිනොච්චි ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 573 බලසේනා බළ ප්‍රදේශයේ පදිංචි පවුල්වල සිසුන් 275 දෙනෙකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 06 දින කොරක්කන්කඩ්ඩු ශාන්ත අන්තෝනි රෝමානු කතෝලික පාසලේදී සහ දකුණු වට්ටකච්චි දමිළ මිශ්‍ර පාසලේදී පැවැත්විණ.

ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම උත්සවයට 573 බලසේනාධිපති, අනෙකුත් නිලධාරීන්, සෙසුනිලයින්, විදුහල්පතිවරු, ගුරුවරු ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ. මෙම උපකරණ පිරිනැමීම පිණිස වූ මාහැඟි කටයුත්තට අනුග්‍රාහක දායකත්වය, පරිත්‍යාගශීලී සුරේන් මැල්කම් ද සිල්වා යන අය විසින් ලබාදී තිබුණි.

---

# "අංගම්පොර" දෙවන සටන් කණ්ඩායම විසිර යති...





පෞරාණික ආත්මාරක්ෂක සටන් කලාව ප්‍රචලිත කිරීමේ අරමුණින් පැවැත්වූ ස්වදේශීය "අංගම්පොර "ආත්මාරක්ෂක සටන් කලා මූලික පුහුණු පාඨමාලා අංක 02 සාර්ථකව හැදෑරුවන් හට සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 05 දින කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථාන පරිශ්‍රයේ පිහිටි "දස බල රාවනා" අත්හදා බැලීම හා සංරක්ෂණ ගම්මානයේදී පැවැත්විණ. එහි සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී  එන්ඩීසී පීඑස්සී සහභාගි විය. එහිදී පාඨමාලාව සාර්ථකව නිම කරන ලද යුද්ධ හමුදා සාමාජිකයින් විසින් අංගම්පොර සටන් කලාව පිළිබඳ ඔවුන් උගත් ශිල්පීය දක්ෂතාවයන් විදහා දැක්වීමේ නිරූපණයන්ද ඉදිරිපත් කරන ලදී. අංගම්පොර උපදේශක රිටිගල සින්නක්කාර පරපුරේ කලාකීර්ති කලාවිභූෂණ දේවින්ද ලක්සිරි රණසිංහ මහතා විසින් මෙම ස්වදේශීය ආත්මාරක්ෂක සටන් කලාව දෙවන සෙබලුන් කණ්ඩායමද පුහුණු කරවන ලදී.



# නව ගොඩනැගිලි සංකීර්ණය සෙබළ අයිතියට...





පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ ස්ථාපිත 68 සේනාංක මූලස්ථානයේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක්ව පැවති මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය අභිනවයෙන් ඉදිකර 2019 දෙසැම්බර් 31 දින යුද්ධ හමුදා සාමාජිකයින්ගේ අයිතියට පත්කරන ලදී. 68 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජීඑස් ආරියසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ මූලිකත්වයෙන් ඉදිකරනු ලැබූ එම ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගි විය.

## සුහදත්වය වර්ධනයට වොලිබෝල් තරඟාවලියක්...



යුද්ධ හමුදා සෙබලුන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් ඉහළ නැංවීම සහ ඔවුන් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථානය සහ ඒ යටතේ පාලනය වන ඒකකයන්හි සියලුම නිලයින්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු වොලිබෝල් තරඟාවලියක් ඉකුත් ජනවාරි 26 දින 7 ශ්‍රීලයුුබ ක්‍රීඩා පිටියේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි. එහිදී තරඟාවලියේ ශූරතාවය හිමිකර ගැනීමට 6(සෙව්) සබුබ ඒකක කණ්ඩායම සමත් වූහ. අවසන් මහා තරඟය පැවති අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක් වූ මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ජයග්‍රාහකයින් වෙත කුසලාන පදක්කම් පිරිනැමිණ. ඉනපෙ (මු) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එස් රාජකරුණා යූඑස්පී ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක්ද ඊට එක් වූහ.





# ලේ දන්දීමේ වැඩසටහනක්

බටහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ 7 වන සංවත්සර දිනයට සමගාමීව යුද්ධ හමුදා සාමාජිකයින් 400 කට වැඩි පිරිසක් ඉකුත් ජනවාරි 03 දින රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහනකට එක්වූහ. ජාතික ලේ බැංකුවේ නිලධාරීන් සහ යුද්ධ හමුදා සාමාජිකයින් එකතුවෙන් සංවිධානය කළ මෙම ලේ දන්දීමේ කඳවුර ශ්‍රී බෝධිරාජාරාම යුද්ධ හමුදා විහාරස්ථානයේ දී පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එම්එල් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුලු නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයින් විශාල පිරිසක් සහභාගි වූහ.







## යුධෝපකරණ සේවා අධ්‍යක්ෂගේ සංචාරයක්...





යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් සීයූ මාරසිංහ ආර්එස්පී යූඑස්පී පසුගිය දෙසැම්බර් 19 දින යුද්ධ හමුදා රෙදිපිළි ගබඩා පරිශ්‍රයේදී වාර්ෂික යුධෝපකරණ කාර්මික පරීක්ෂණය සිදුකරන ලදී. එහිදී යුද්ධ හමුදා රෙදිපිළි ගබඩාවේ වත්මන් තත්වය, ගබඩා කලමණාකරණය හා එහි ආරක්ෂිත විධික්‍රම මෙන්ම කාර්මික ක්‍රියාවලිය පිළිබඳ ඔහුගේ පූර්ණ අවධානයට ලක්විය. සංචාරය අවසානයේදී යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ විසින් එහි සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය.



# රෙජිමේන්තු ඉතිහාසය

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය





වත්මන් කර්නල් සේනාවිධායක
මේජර් ජෙනරාල්
ආර්එල්සී ප්‍රනාන්දු එච්ඩීඑම්

වත්මන් යුද්ධ හමුදාවේ ස්ථාපිත රෙජිමේන්තු අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායට ප්‍රමුඛස්ථානයක් හිමිවනුයේ එය වසර 70 ක අභිමානවත් ඉතිහාසයකට හිමිකම් කීමත්, හටකාර්‍ය්‍ය සම්පාදනය සිදු කරන ප්‍රධානතම බලකායන්ගෙන් එකක් වීමත් හේතුවෙනි.

මිට දශක 07 කට පෙර හටකාර්‍ය්‍ය සම්පාදන ඒකකයක් වශයෙන් ආරම්භ වු මෙම බලකාය වත්මන්ව ප්‍රධාන ගබඩා සංකීරණ 03ක්, යුධෝපකරණ කර්මාන්ත ශාලාවක්, සමස්ත යුද හමුදාවටම අවැසි වන උපකරණ පාලක නිළධාරින් හා උපකරණ පාලක සැරයන් මේජර්වරුන් පුහුණු කරවනු ලබන පුහුණු පාසලක් හා ආසේමු වලට සමගාමීව පිහිටා ඇති ඒකක 07 කින් සමන්විතව ක්‍රියාත්මක වේ. යුධෝපකරණ බලකාය ආරම්භයේ සිට සහ දැනට සේවයේ යෙදී සිටින නිලධාරී/සෙසු නිළයින් විසින් මහත් කැපවීමෙන් හා වගකීමෙන් යුතුව තම සේවාව හටපිරිස් වලට ලබා දෙමින් සමස්ත යුද හමුදාවේ උන්නතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් අති විශාල මෙහෙවරක් ඉටු කරනු ලබයි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය, බලකායක් වශයෙන් ආරම්භ කිරිමේ මුලික කටයුතු වර්ෂ 1949 ක් වූ ඔක්තෝබර් මස 14 වන දින සිදු කර ඇත. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නගාසිටුවීමෙන් පසු 1949 නොවැම්බර් මාසයේදී රාජකීය යුධෝපකරණ බලකාය භාරයේ තිබූ අවි හා පතුරොම් භාරගැනීමෙන් අනතුරුව රජයේ බඩු ගබඩාවල අසුරන ලද අතර, 1950 පෙබරවාරි මස 01 දින යුධෝපකරණ ගබඩාහල කිරුලපන දී ආරම්භ කර ඇත.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නගාසිටුවීමේදී බ්‍රිතාන්‍ය යුද්ධ හමුදාවේ උපදේශකවරයෙකු වූ රාජකීය යුධෝපකරණ බලකායේ මේජර් එච් පී බ්‍රෙවර් නම් වූ ඉංග්‍රීසි ජාතික නිලධාරී ද්විතීයනය කොට 1950 මාර්තු මස 11 දින ශ්‍රී ලංකාවට එවීමෙන් පසු ඔහු ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රථම යුධෝපකරණ අධ්‍යක්‍ෂක වශයෙන් රාජකාරී ආරම්භ කර ඇත. තවද 1950 මාර්තු මස 29 වන දින යුධෝපකරණ බළකාය ප්‍රථම වරට ඒකකයක් ලෙස නිල වශයෙන් ස්ථාපිත කරනු ලැබීය.

1949 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා පනාගොඩ ස්ථාපිත කර තිබූ යුධෝපකරණ බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානය වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 10 වන දින හොරණ දොඹගොඩ ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදී. එයට සමගාමීව යුද්ධ හමුදාවේ අනෙකුත් ඒකකයන් විසින් භාවිතා කරන ලද භාණ්ඩ හා උපකරණ සංස්කරණය කිරීමටත්, පැස්සුම් ශිල්පී පාඨමාලා ඇතුළු කාර්මික පාඨමාලාවන් පවත්වාගෙන යාමටත්, මෙම රෙජිමේන්තුවේ සහ අනෙකුත් රෙජිමේන්තුවල සාමාජිකයින්ගේ වෘත්තීය නිපුණතාවය වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙහිලා උපකරණ පාලන පාඨමාලා ඇතුළුව අනෙකුත් පාඨමාලා පවත්වාගෙන යාම පිණිස යුද්ධ හමුදා කර්මාන්ත ශාලාවක් සහ පුහුණු පාසලක්ද මෙම මුලස්ථාන සංකීර්ණයේ පිහිටුවා ඇත.

හටකාර්ය සම්පාදනය පමණක් නොව ක්‍රීඩා ඉසව් 26 ක් වෙනුවෙන් ක්‍රීඩකයන් යොමු කරවමින් 2015 හා 2017 වර්ෂයන්හි බැඩ්මින්ටන් ශූරතාවය ද, 2018 වර්ෂයෙහි වොලිබෝල් ශූරතාවය ද, ඕවර් 50 ක්‍රිකට් ශූරතාවය ද දිනා ගනිමින් මෙම රෙජිමේන්තුව සමස්ත යුද්ධ හමුදාව තුළ යුධෝපකරණ බළකා නාමය පතුරුවා ඇත.

මෙම රෙජිමේන්තුවේ රාජකාරි නියුතුව සිටි කර්නල් සේනාවිධායකවරුන්, මධ්‍යස්ථාන සේනාවිධායකවරුන්, අනෙකුත් නිලධාරින් සහ සෙසු නිලයින්ගේ මනා කැපවීම මත වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 10 වන දින ජාත්‍යන්තර තලයේ ක්‍රිකට් ක්‍රීඩාංගණයක් එවකට යුද්ධ හමුදාධිපති තුමාගේ සුරතින් කඳවුර භූමියේ විවෘත කිරීමද විශේෂත්වයකි.

එසේම රගර්/පාපන්දු, ස්කොෂ්, ටෙනිස්, බැඩ්මින්ටන් ආදී ක්‍රීඩාපිටි මෙන්ම නවීන පන්නයේ යන්ත්‍ර උපකරණ වලින් හෙබි ආපන ශාලාවක් ඇතුළුව අංග සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකර යුද්ධ හමුදාධිපතිතුමාගේ සුරතින් 2019 නොවැම්බර් 08 වන දින විවෘත කිරීමත් සමස්ත යුද්ධ හමුදාවේම ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා කෞශල්‍යය නැංවීමෙහිලා මෙම රෙජිමේන්තුව ගත් විශිෂ්ට පියවරකි. මෙම රෙජිමේන්තු මධ්‍යස්ථානය පනාගොඩ සිට වත්මන් කඳවුර පිහිටා ඇති දොඹගොඩ ස්ථාපනය කර වසර 12 ක් වැනි කෙටි කාලයක් ගත වී තිබුණද සියලු නිලධාරීන්ගේ හා සෙසු නිලයින්ගේ ඇප කැප වීම මත එය ලබාගෙන ඇති ප්‍රගතිය ප්‍රසංශනීය වේ.

දශක 07 ක් වැනි දීර්ඝ කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය යුද හමුදාව තුළ අභිමානවත් රෙජිමේන්තුවක් වශයෙන් "අප්පමන්තා න මියන්ති" යන ආදර්ශ පාඨය පෙරදැරිව මව්බිම වෙනුවෙන් තම රාජකාරී නොපැකිලිව ඉටු කරමින් සිටි.

ඉදිරිපත් කිරීම
රෙජිමේන්තු මධ්‍යස්ථාන
ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය

# සුබ මොහොතින් නව වසරේ රාජකාරී අරඹයි...





2020 නව වසර උදාව නිමිත්තෙන් ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කළ උත්කර්ෂවත් උත්සවයක් ඉකුත් ජනවාරි 01 දින පවත්වන ලදී. එහිදී ජාතික ධජය හා යුද්ධ හමුදා ධජය එසවීම, ජාතික ගීය සහ යුද්ධ හමුදා ගීය ගායනා කිරීම, රාජ්‍ය සේවක ප්‍රතිඥාව කියවීම ඇතුලු චාරිත්‍රානුකූල කටයුතු වලින් අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහයක් ද පැවැත්විණ.

# සුහද හමුවක මතක සටහන්...

ආරක්‍ෂක සේනා මූලස්ථානය මධ්‍යම ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ හා බංගලාදේශ මහකොමසාරිස් කාර්යාලයේ ආරක්‍ෂක උපදේශක Commodore SM Hakim (ND) BSP ndc ncc psc BN) අතර හමුවක් ඉකුත් ජනවාරි 06 දින සිදුකෙරිණ. එහිදී දෙපාර්ශවය අතර පවත්නා සුහදත්වය වර්ධනය කරමින් දෙරටට වැදගත් පොදු කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.







# "ෆන් එකට සෙට් වෙන්න මේ අයත් එකතු කර ගන්න"

නේකවිධ සන්නිවේදන මාධ්‍යයන් අතරින් එදා පටන්ම ගුවන් විදුලියට හිමිව තිබූ තැන අදටද එලෙසම වලංගුව පවතියි. බොහෝ විට රූපවාහිණිය යම් තරමකට ඒ හා තරඟයකට එක්ව තිබුණද හද්ද පිටිසර ගම් නියම්ගම් සිසාරා තවමත් ගුවන් විදුලිය මුල් තැනට පැමිණ ඇත. අන්තර්ජාලය හෝ වෙනත් දියුණු සන්නිවේදන ක්‍රම එතරම් ව්‍යාප්තව නොමැති අප රටෙහි ගුවන් විදුලිය හරහා හැකි පමණ ඒ සියලු හිඩැස් පුරවා ඇත. සරලව කියතොත් තම නිවසේ ගුවන් විදුලි යන්ත්‍රයක් නොමැති වුවද අඩුතරමින් මඟ තොටේදී හෝ ඊට සවන්දීමේ හැකියාව වැඩි දෙනෙකුට ලැබේ.

මෙම ගුවන් විදුලිය තුළ මෑතකාලීනව හතු පිපෙන්නාක් සේ මතුව ආ "එෆ්එම්" නාලිකා රැසකි. තනි අකුරේ, අකුරු දෙකේ හෝ අකුරු තුනෙන් කියවෙන නම්වලින් පිරි එම "එෆ්එම්" නාලිකා ඇතැම් අයට "පොපියන චමත්කාරයකි". නොඑසේ නම් "හද ගැහෙනා රාවයකි". කෙසේ හෝ පාරතොටේ, බස් රථයේ, බාබර් සාප්පුවේ, ලොතරැයි කුඩුවේ හෝ වෙළඳ සැලේදී ඇසෙන එකී එෆ්එම් විකාශනයන් තුළ ඇති නිසරු වත්පිළිවෙත් අප සමාජයට කොතෙක් ගෝචර වන්නේ දැයි මැනබැලීම වටී.

## ගීත ඉල්ලීම්...

ගීත සඳහා ඇත්තේ එෆ්එම් රේඩියෝ නාලිකාවල ඉහළ ඉල්ලුමකි. එහිදී ගීත ඉල්ලුම් කරන කෙනාට තම හත්මුතු පරම්පරාවේම අයගේ නම් ටිකද, කිසිවක් නොදන්න අහළ පහළ අයගේ නම්ද එක හුස්මට පැවසිය හැකිය. සමහර විට මෙසේ කියන නම් අතර, මියගිය අයගේ නම්ද ඇතුළත් වීමට ඉඩ ඇත. කෙසේ වුවද පාරතොටේ බස් රථවල, වැඩපලේ හෝ නිවසේ සිටින සෙසු ශ්‍රාවකයන්ට කිසිවකුගේ ගීත ඉල්ලීම්වලට කන්දී, දුරකථන බිල් නොගෙවාම සෑහෙන පිරිසකගේ නාමාවලියක් නොමිලයේම අසන්නට හැකිය. මෙලෙස ගීත ඉල්ලීම් ප්‍රචාරය කිරීමේදී නිවේදකයා විසින් ගීතයේ පද පේළියක් ගායනා කොට ගීතයට පොඩි තල්ලුවක් දෙන අයුරුද සුලභව ඇසිය හැකිය.

"ආ කුසුම්... කුසුම් කොහෙන්ද කතා කරන්නේ"

"මම දෙහිඅත්තකණ්ඩියෙන් කතා කරන්නේ"

"එතකොට කව්ද ගීතයට එකතුකර ගන්නේ"

"අම්මා, තාත්තා, අයියා, අක්කා, ලොකු පුංචි, පහළ ගෙදර සමන් මල්ලී, ආ... නව මැල්සිරිපුර අල්මේදා අංකල්, වජිර පුංචි, චූටි බබා සමීර, ලොකු චූටි ගිම්හාන, සව්දිවල ඉන්න ප්‍රියවතී අක්කා, බහරේන්වල නුවන් අයියාත් එකතුකර ගන්නව. ඒ වගේම මේ ගීතය අහන හැමෝමත්, එකතුකර ගන්නව, ඔය දෙන්නවත් එකතුකර ගන්නව"

"හොඳයි බොහොම ස්තූතියි අපට කථා කලාට. එහෙනම් මෙන්න ඔයාගේ කැමතිම ගීතය"



## කන පැලෙන්න සිංදු...

වැරදීමකින් හෝ පුද්ගලික බස් රථයකට ගොඩ වුවහොත් තමාගේ කැමැත්ත අකැමැත්ත කෙසේ වුවද රියදුරුගේ හෝ කොන්දොස්තර තැනගේ අභිමතය පරිදි නොමිලයේ ගීත ඇසීමේ මහගු අවස්ථාවද ඔබියාට උදාවේ. එසේම එය සුඛෝපභෝගී බස් රථයක් නම් දොර ජනෙල් වසා ඇති නිසාම කන පැලෙන තරමේ ශබ්දයෙන් එය රසවිඳීමට හැකිය. එම බස් රථයේම ඔබ ගමන් ගන්නේ පැය තුන හතරක් ගතවන දුර ගමනක් නම් බොහෝ විට ඔබට ගීත කටපාඩම් කර ගැනීමේ හැකියාවද ලැබේ. මන්ද යත් එම ගමන පුරාම සමහර බස් රථවල එකම කැසට් හෝ සීඩී පටය ඇසීමට සලස්වන නිසාය. තවද බස් රථවල ගමන් කරන ඇතැමෙකුට වමනය යාමද සුලභව දැකිය හැකිය. එසේ වන්නේ බස් රථයේ විකාශනය වන එෆ්එම් නාලිකා වල නිවේදක නිවේදිකාවන්ගේ " කන්දොස් කිරියාව" නිසාම වන්නටද බැරිනැත.



## ජංගම රෙකෝඩ් බාර්...

මෑතක සිට ත්‍රීරෝද රථවලද ජංගම රෙකෝඩ්බාර් පවත්වාගෙන යනු පෙනේ. ඕනෑම රාත්‍රියක දී වුව මීටර් 100 ක් 200 ක් තරම් දුරකදී වුවද පැහැදිළිව පැමිණෙන්නේ ත්‍රීවිලරයක් බව හඳුනාගත හැකිවන තරමට ඒවායේ ඇති ගුවන් විදුලි යන්ත්‍රයේ හෝ කැසට් රෙකෝඩරයේ හඬ ඇසේ. ත්‍රීරෝද රථවලට සවිකොට ඇති ඇතැම් කැසට් යන්ත්‍ර, වටිනාකමින් දෙවෙනි වන්නේ එම ත්‍රීරෝද රථයට පමණි. ත්‍රීරෝද රථ තුළ එෆ්එම් නාලිකා වලට අයත් ස්ටිකර් ඇලවීමද අලුත්ම විලාසිතාවකි. එසේම නිතර දෙවෙලේ එම නාලිකාව ඇසීම මගින් මුදල් ත්‍යාග පිරිනමන බැව්ද කියවේ. ඒ නිසාම ඇතැම් ත්‍රීවිල් කරුවන් "හයර්" ඇතත් නැතත්, එහි ගමන් ගන්නා මගියාට කරදරයක් වුවත් නැතත් කන පැලෙන සද්දයෙන් රෝඩියෝව දමාගෙන යයි.

## ප්‍රවෘත්ති...

අතිශය දියුණු වත්මන් ලෝකයේ පුවත් සන්නිවේදනය ඇසුරු සැනින් සිදුවේ. බීබීසී, සීඑන්එන්, ප්‍රංශ පුවත් වැනි සේවා මගින් ලෝකයේ එහා කෙළවර සිදුවන දේ ඒ මොහොතේම මෙහා කෙළවරේ සිටින්නෙකුට වුවද දැනගත හැකිවේ. ඕනෑම අයෙකුට අන්තර්ජාලය ඔස්සේ මොහොතින් මොහොත ලෝකයේ සිදුවන වෙනස්වීම් පහසුවෙන් බලාගත හැකිය. මෙවන් වටපිටාවක් තුළ අපගේ පෞද්ගලික ගුවන් විදුලි මාධ්‍ය හැසිරෙනුයේ අමුතුම ආකාරයකටය. ඔවුන් පුවත් සන්නිවේදනය කරනුයේ විශාල ලෙස කේවල් කිරීමකින් අනතුරුවය. උදේ 08.00 තිබෙන ප්‍රවෘත්ති ගැන 07.30 ට ඉඟියක් දේ. එසේත් නොමැතිනම් කියනුයේ පුවත් සිරස්තල පමණි. එහිදීද අසන්නට වන්නේ ප්‍රවෘත්ති වලට වඩා වෙළෙඳ දැන්වීමය. පුවත් සිරස්තර ගෙන එන්නට වෙනම අනුග්‍රාහකයින් සිටී. එයින්ද දේශීය පුවත් ගෙන ඒමට තවත් අනුග්‍රාහක ආයතනයන් සිටී. විදෙස් පුවත් වලට තවත් අනුග්‍රාහකයකි. මේ ආකාරයට සම්පූර්ණ ප්‍රවෘත්ති විකාශය අසන්නට නම් ශ්‍රාවකයා ඉහත සියලුම අනුග්‍රාහක හවතුන්ගේ වෙළෙඳ දැන්වීම් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් අසා සිටිය යුතුය. මෙහි තවත් හාස්‍ය ජනක කරුණක් වන්නේ කේවල් කරමින් වරු ගණන් දිගට ඇදගෙන අවුත් විකාශය කරන ප්‍රවෘත්තිවල ඇත්තේද එහෙන් මෙහෙන් ඇහිඳගත් තොරතුරක් පමණි. එකම දේ රහ කරමින් එහාට මෙහාට හරවා එය ප්‍රකාශ කරන විලාශය ඇසීමට හිරිකිතය. අනෙක් කරුණ නම් ප්‍රවෘත්ති අනුග්‍රාහකයින්ගේ වෙළෙඳ දැන්වීම් සඳහා විනාඩි 05 ක් පමණ ගතවුවද, ප්‍රවෘත්ති විකාශනයටම ගතවන්නේ විනාඩි 02 ක් හෝ 03 ක් වැනි කෙටි කාලයකි.

වේලාව සවස 0630 යි. මේ "මුබ එෆ්එම්" ගුවන් විදුලියයි.

මෙන්න ප්‍රවෘත්ති. මුලින්ම දේශීය පුවත්. දේශීය පුවත් ඔබ වෙත ගෙන එන්නේ... සැලෝලයිට් බිස්කට් අනුග්‍රාහයෙන්...//

.....................................

මීලගට "මුබ එෆ්එම්" විදෙස් පුවත්...විදෙස් පුවත් ඔබ වෙත ගෙන එන්නේ ඉටිරෙදි සාරි අනුග්‍රහයෙන්...//

...........................

මීලගට "මුබ එෆ්එම්" ක්‍රීඩා පුවත්... ක්‍රීඩා පුවත් ඔබ වෙත ගෙන එන්නේ ඔට්ටුපාල් ලෙදර් අනුග්‍රහයෙන්...//

............................

මීලගට "මුබ එෆ්එම්" කාලගුණ පුවත්... කාලගුණ පුවත් ඔබ වෙත ගෙන ඒමේ සමාදර දායකත්වය පටකුඩ ලිමිටඩ්...//

## මුදල් ත්‍යාග පිරිනැමීම...

මුදල් ත්‍යාග පිරිනැමීමද දැන් දැන් මෙම රේඩියෝ නාලිකා වල විලාසිතාවක් බවට පත්ව ඇත. නමුත් ඒ සඳහා පැය දෙක තුන එසේත් නොමැතිනම් වරුවක් පමණම එකදිගට ඊට සවන් දිය යුතුය. බිත්තර දමන රන් කුකුල්ලුද, අඬලන කුක්කුං මහත්තුරුද, බෝම්බ සෙල්ලම්ද මේ නාලිකාවල නිමක් නැත. සමහර තරඟ මුලු දවස පුරාම පැවැත්වේ. ඒවායෙන් ජයග්‍රහණය කිරීමට ගෙදරින් එළියට නොබැස සියලු වැඩ කටයුතු පසෙකලා ඊටම සවන්දිය යුතුය. ගෙදර දොර මොන ප්‍රශ්න තිබුණත් ගුවන් විදුලි එෆ්එම් නාලිකා සමඟ "ෆන්" එකට "සෙට්" විය හැක.

## නිවේදක නිවේදිකාවන්ගේ මුකුළු...

බොහෝ එෆ්එම් ගුවන් විදුලි නාලිකා වල මෙය සුලභව දැකිය හැකිය. මෙය එක්තරා ආකාරයකට නිවේදක නිවේදිකාවන්ට වැළඳෙන රෝගයක් වැනිය. පැය ගණන් එකදිගට විකාශනය කෙරෙන වැඩසටහන් වලදී මෙම තත්වය කැපී පෙනෙයි. වැඩසටහනට කිසිසේත්ම අදාළ නොවන වල්පල් සියල්ල කිසිදු පැකිලීමකින් තොරව ඔවුන්ගේ අභිමතය පරිදි ගෙනහැර දක්වයි. විටෙක කෙඳිරිගායි. විටෙත කොක් හඬලයි. තවත් විටෙක කොඳුරයි. මුකුළුවල සීමාවක් නැත. කිසිවෙකු හිනා නොවුනත් ඉඳහිට විහිළු තහලුද කරයි. ඔවුන් කියන විහිළු කතා අවසානයේ පටිගත කළ හිනා හඬක් ප්‍රචාරය කරනු ලබන්නේ ඒවාට සජීවී ලෙස කිසිවෙකුට සිනා නොයන බැවි

ඔවුන් දන්නා නිසාම විය හැකිය. අදාළ වැඩසටහන් නිෂ්පාදකවරුන්, නිවේදක නිවේදිකාවන්ට මැදිරිය භාරදුන් පසු ඔවුන් කුමක් කියන්නේදැයි නොදනී. එය දන්නේ ඊට සවන් දෙන්නවුන් පමණි.

## ජනප්‍රියම ගීතය...

එෆ්එම් නාලිකාවල ජනප්‍රියම ගීතය තෝරන්නේද මනස්කාන්ත අයුරිනි. දෙතුන් දෙනෙකු ලබාදෙන දුරකථන ඇමතුම් මගින් හෝ එවැනිම වූ පෝස්කාඩ් හෝ එස්එම්එස් පිණිවිඩ මගින් ලංකාවේම ජනප්‍රිය ගීතය තෝරා ගැනීමට ඔවුන් දක්ෂය. දෙතුන් දෙනෙක්ගේ කැමැත්ත ලංකාවේම කැමැත්ත බවට පත්කිරීමේ විශ්මකර්ම විජ්ජාවක් ඔවුන් සතුය.

දේශාභිමාන ගීත, පැරණි ගීත, විරිඳු, කවි, ළමා ගීත ඇතැම් එෆ්එම් නාලිකා වලට අරහන්ය. "ටොප්" එකේ නැගල යන "ෆන් එකට සෙට් වෙන" රජගහේ බඩුවලට ඉල්ලුම වැඩිය. කිසිඳු වචනයක් නොතේරුනද හින්දි ගීත ප්‍රචාරය වීමට වෙලාවක් කලාවක් නැත. ඇතැම් නාලිකා වල රෑ දෙගොඩ හරියේ සිට එළිවන තුරු ඇසෙන්නේ හින්දි ගීතය. සමහර නාලිකාවල උදෑසන වැඩසටහන් ඇරඹෙන්නේද හින්දි ගීත වලිනි.

මීට කලකට ඉහතදී අපට අලුයම ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළ සැනින් ඇසුනේ පිරිත්ය. නැතිනම් ධම්ම චින්තාව හෝ සියලු ආගමික උතුමන්ලාගේ හරවත් උපදේශයකි. දේශාභිමාන ගීතය, එසේත් නොමැතිනම් මව්ගුණ ගීය. මුලදී නැතත් දැන් දැන් බොහෝ ගුවන් විදුලි නාලිකාවල එම තත්වය දැකගත හැකි වීම නම් සතුටට කරුණකි. නමුත් ඇතැම් නාලිකා වල තවමත් අලුයම සිට ඇසෙන්නේ සමහර විට "කඩුවෙල සමන්ති" ගීත ඉල්ලන හඬය. නැතිනම් "පිළිමතලාවේ පුෂ්පලතා" ගීත ඉල්ලන හඬය. එසේත් නැතිනම් "තඹුත්තේගම මහින්ද" හෝ "වැල්ලවත්තේ නවාස්" ගීත ඉල්ලීම් කරන අයුරුය. ඔවුන්ගේ පරම්පරාවල සියලු දෙනාගේ නම්වලින් අලුයම අපගේ දෙසවන් පුරවාගෙන "මෝනින් ෆන්" එක විඳ රාජකාරියට පිටත් විය හැකිය.

එසේම එක ගීතයක් අසන්නට වෙළඳ දැන්වීම් දහයක් වත් ඇසිය යුතුය. එය කෙසේ වුවද හරියටම තත්පර ගණනට ගීතය විකාශය කරන්නටද ඔවුහු පොරොන්දු දෙති.

හරියටම තව විනාඩි 3 තත්පර 20 කින් ඔබට එච්ආර් ජෝතිපාලගේ "මහද නමැති වන බඹරා" ගීතයට සවන්දිය හැකිය.

## සංවාද...

බොහෝ එෆ්එම් ගුවන් විදුලි නාලිකා වල රසවත් හරවත් සංවාදවලට ඉඩ නැත. ඇත්නම් ඒවා අතලොස්සකි. ඉඳහිට කවුරු හෝ ජනප්‍රිය යැයි කියා ගන්නා අයෙකු මැදිරියට කැඳවා කතාබහ කරති. (එය ඔවුන්ගේ භාෂාවෙන් කියතොත් දොඩමළු වීමකි) එහෙත් ඒ සංවාද වලින් කිසිවෙකුට ප්‍රයෝජනයක් නැත. ඇතැම්විට රටම පිළිගත් වැදගත් ක්ෂේත්‍රයන්හි නියුතු වුවන් සංවාද වලට කැඳවූවත් ඔවුන්ගෙන් අසන්නේද තම බිරිඳ හෝ ස්වාමියා හමුවූ හැටි, ආදරය ගැන හිතෙන දේවල්, කැමට කැමති දේවල්, මේ ආදී කිසිඳු වැදගැම්මකට නැති ප්‍රශ්නය.

## මුදල් බෙදාදීම්...

මුදල් බෙදාදීම්ද දැන් දැන් නාලිකාවල අලුත්ම මෝස්තරයක් වී තිබේ. (මෙය රූපවාහිනී නාලිකා වලද ජයටම කෙරේ) මුල් අවධියේ ශ්‍රාවකයින් ගුවන් විදුලියට සවන් දෙන ලද්දේ එහි ඇති වැඩසටහන් වල ගුණාත්මක බව හා රසවත් බව සලකාය. නමුත් දැන් ඇතැමුන් ඊට සවන් දෙනුයේ පූරුවේ වසනාවකට කීයක් හෝ ලැබේවි යන සිතුවිල්ලෙනි. ගුවන් විදුලි යන්ත්‍රයේ අදාළ නාලිකාව ක්‍රියාත්මකව තිබෙද්දී හොර හතුරෙක් දොරට තට්ටු කළද රෑ දෙගොඩ හරියේ පවා පැකිලීමකින් තොරව දොර අරින්නට ඇතැම් කාන්තාවන් සැදී පැහැදී සිටිනුයේ අදාළ එෆ්එම් නාලිකාවේ මහත්තුරුන් මුදල් බෙදන්නට පැමිණ ඇතැයි සිතාගෙනය. කලකට ඉහතදී ගුවන් විදුලි යන්ත්‍ර පාවිච්චිය වෙනුවෙන් ශ්‍රාවකයින් රජයට ලියාපදිංචි ගාස්තුවක් ගෙවන ලදමුත් දැන් උදාවී ඇත්තේ අදාළ ආයතන මගින් ගුවන් විදුලියට සවන්දීම වෙනුවෙන් ශ්‍රාවකයාට මුදල් ගෙවන යුගයකි. අද එය කොතරම් තරඟකාරී ලෙස ව්‍යාප්තව ඇති දැයි කියතොත් ඇතැම් නාලිකාවල අයත් පුද්ගලයින් නිවෙස්වලටම ගොස් දාහයි...දහදාහයි....පාලොස්දාහයි... ආදී වශයෙන් මුදල් තොග වශයෙන් අහළ පහළ සැමටම බෙදන්නට පෙළඹී ඇත්තේ "නම" කිව්වොත් සල්ලි තමයි යනුවෙන් ප්‍රකාශ කරමිනි. නමුත් මෙහි අවසනාවන්ත තත්වය නම් මෙතරම් අතදිගහැර වියදම් කිරීමට මුදල් එම ආයතන සතුවෙද්දීත් ගංවතුර නායයෑම් ආදී හදිසි අවස්ථාවලදී ජනතාවට බෙදාදෙන්නට මුදල් හෝ ද්‍රව්‍ය ආධාර ඉල්ලා එම ආයතන ජනතාවටම පිංසෙන්ඩුවීමයි.

කෙසේ හෝ ඇතැම් එෆ්එම් නාලිකා හරහා සමාජයට රටට අතිමහත් මෙහෙයක් ඉටුවන බවද මෙහිලා සඳහන් කළ යුතුමය. ගුවන් විදුලි ආචාරධර්ම ආරක්ෂා කර ගනිමින් සමාජ හරපද්ධතීන්ට හානි නොවන සේ කටයුතු කරන්නට එම ආයතන ඉදිරිපත්ව සිටීම පැසසිය යුත්තකි. එසේ නොවන ඇතැම් ගුවන් විදුලි මාධ්‍යය ආයතන හුදු වෙළඳ අරමුණු සහ පහත් රුචිකත්වය පදනම් කර ගනිමින් අපගේ භාෂාව සංස්කෘතිය අමුඅමුවේ විනාශ කිරීම අපරාධයකි. වර්තමානයෙහි සාම්ප්‍රදායික රේඩියෝ කලාව වෙනසකට භාජනයට වී ඇතත් අවාසනාවකට එය වැඩිපුර බරවී ඇත්තේ ගුණාත්මක නොවන පැත්තටය. හුදෙක්ම මෙවැනි ලිපිවල අරමුණ වනුයේ එකී ගුවන් විදුලි ආයතන නිර්දය ලෙස විවේචනයට ලක් කිරීම හෝ ඒවාට අපහාස කිරීම නොවන අතර, සමාජය තුළ ඒ පිළිබඳව ඇති නොසන්සුන්තාව එම ආයතන අවබෝධ කරගනු ඇතැයි යන විශ්වාසයෙනි. ඉල්ලුමට අනුව සැපයුම පදනම් කර ගනිමින්, ඉල්ලන ඕනෑම දෙයක් දෙනවා වෙනුවට යහපත් හරවත් ඉල්ලුමක් සමාජය තුළ නිර්මාණය කොට ඊට අනුකූලව සැපයුම ලබාදෙන්නට සියලු එෆ්එම් නාලිකාවන් උනන්දු වන්නේ නම් කොතරම් අගනේද? අගාධයකින් මිය යාමට ආසන්න වෙත්ම කකුල වන වනා ෂපාන් එකේ මිය යාමට ඉඩ හැරීම වෙනුවට අවසන් මොහොතේ පරඬැලක එල්ලී හෝ ඉන් ගොඩ ඒමට උනන්දු කරවීම නොවටීද?

මේ ලිපියේ ඉතිරි කොටස හරියටම තව විනාඩි 27 කින්

එතෙක් ඔබට මේ ලස්සනම... ලස්සනම... ලා...ස්...ස...න...ම ආදර ගීතය.

"කුවු කුවු හෝනාහේ"



මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ

## සංවත්සර දින සමරමින්...



17(සෙව්) බළඇණිය ගජබා රෙජිමේන්තුව ආරම්භ කර 2019 දෙසැම්බර් 01 දිනට වසර 12 ක් සපිරීම නිමිත්තෙන් ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් වැඩසටහන් රැසක් සිදුකරන ලදී. අණදෙන නිලධාරී මේජර් ඩබ්ලිව්ජීටීඑස් කුසුම්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී හට කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පිරිණැමීම, සියලු නිල තේපැන් සංග්‍රහයක් සහ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම, පිරිත් දේශනයක් පැවැත්වීම සංවත්සර දින වැඩසටහන් අතර කැපී පෙනුන අංග විය.

## ආඩම්බර ගමනක සාඩම්බර සටහන්...



5 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළඇණියේ 28 වන සංවත්සරය 2019 නොවැම්බර් 01 දිනට යෙදී තිබිණ. ඒ නිමිත්තෙන් ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් ඇරඹි සංවත්සර කටයුතු අතර අණදෙන නිලධාරී වෙත කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පිරිනැමීම, පැළ රෝපණය කිරීම, සඳහිරු සෑය සහ සාලියපුර ළමා නිවාසයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ශ්‍රම දායකත්වය ලබාදීම මෙන්ම එම ළමා නිවාසයේ දූදරුවන් වෙනුවෙන් දිවා ආහාර වේලක් ලබාදීමද විශේෂ විය. එසේම සංවත්සර දින පැවැති සංගීත සංදර්ශනයද එහි කටයුතු වර්ණවත් කළේය.

## ගිණුම්කරණ පාඨමාලා අංක 16...

කිලිනොච්චි ආරක්ෂක සේනා බළප්‍රදේශය යටතේ ඇති ඒකක ආවරණය වන පරිදි පැවැත්වූ ගිණුම්කරණ පාඨමාලා අංක 16 2019 නොවැම්බර් 28 සිට දෙසැම්බර් 30 දක්වා ඉදිරි නඩත්තු පෙදෙස (කිලිනොච්චිය) හිදී පවත්වන ලදී.

අදාළ පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානය ඉදිරි නඩත්තු පෙදෙස (කිලිනොච්චි) ආඥාපති මේජර් ජෙනරාල් ඒඩී ඇල්වත්ත ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් දෙසැම්බර් 31 දින සිදුකෙරිණ. එහිදී 39 දෙනෙකු සහභාගී වූ මෙම පාඨමාලාවේ පළමු ස්ථානය සෙ/329789 කෝප්‍රල් ඉන්දික කේඑම්ආර් ද, දෙවන ස්ථානය සෙ/2087662 හා ආසෙ රුද්‍රිගෝ ආර්ඩීආර්සී ද, තෙවන ස්ථානය සෙ/2090724 ආසෙ මානින්ගමුව එම්ඩීජ්යූකේ ද පිළිවෙලින් හිමිකරගත්හ.



# "ආකල්ප සංවර්ධනය තුළින් යහපත් දිවියක්"....



14 සේනාංකයෙහි පැවති දේශනයේදී

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ "ආකල්ප වර්ධනය තුළින් අරුත්බර දිවියක්" උදෙසා වූ දේශන මාලාවක් යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කෙරේ.
ඒ යටතේ "යහපත් පවුල් සංස්ථාවක් ගොඩනගා ගැනීම තාරුණ්‍යය හා කාන්තා සෙබළිය, පුද්ගල සංවර්ධනය, නිරවුල් මානසිකත්වයෙන් සිය වෘත්තීයේ නියැලීම සහ ධනාත්මකව ජීවිතයකට මුහුණදීම" යන කරුණු පිළිබඳව හටපිරිස් තුළ ආකල්ප වර්ධනය කිරීම අපේක්ෂිතය.



2(සෙව්) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායේ පැවති දේශනයේදී

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂක මණ්ඩලයේ රාජකාරී නියුතු ලුතිනන් කර්නල් බීජීඑස් සමන්ති (ජාශිබ) විසින් එම දේශනය මෙහෙයවනු ලබන අතර, අදාළ දේශන පිළිබඳ දිවයිනේ බොහෝ අංශ, ආයතන වෙතින් මේ වනවිටත් මෙම අම වෙත බොහෝ ඇගයුම් හා ඉල්ලුම්ද ලැබෙමින් පවතී.

---



21 සේනාංකයේ පැවති දේශනයේදී



# "යුද සාහිත්‍යය" දේශනයන්...



කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කෙඩෙට් නිලධාරීන් සඳහා පැවති දේශනයේදී

යුද්ධ හමුදා අංශ, ආයතන තුළ හා සිවිල් සමාජය අතර යුද සාහිත්‍යය ප්‍රචලිත කිරීම වෙනුවෙන් යුද හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීපව්‍යාප්තව සිදුකෙරන දේශන මාලාවේ තවත් අදියර තුනක් පසුගියදා 21, 57 සේනාංකයන්හිදී හා කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී පැවැත්විණ.

එම සේනාංක යටතේ ස්ථාපිත බළසේනා, ඒකකවලට අයත් හටපිරිස් විශාල පිරිසකගේ හා කෙඩෙට් නිලධාරීන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති එම දේශන මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරියෙහි නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ යන නිලධාරී විසින් මෙහෙයවන ලදී.

තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට පනදුන් අභීත විරුවන්ගේ මතක හා අත්දැකීම් පිළිබඳ අලුත් පරපුර දැනුවත් කිරීමත්, එකී මෙහෙවරට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් යුද සාහිත්‍යයක් මෙරට තුළ බිහිකිරීමත් මෙම වැඩසටහනෙහි අරමුණයි.




21 සේනාංකයේ පැවති දේශනයේදී

# සිතුවිලි සාගරය

## සෙබල පෙම්වතිය

බිංගෙය තුළ ගුලි වී රෑ තිස්සේ...
මරණ බියට දූවිලි සුව වින්දේ...
හතර වටින් වෙඩි වරුසා ඇසුණෝ...
නෑහුණු ගානට දෑස් පියවුණෝ...

වෙනදා මා එනු දැක දුවගෙන එන...
යාලුවෝ කඳුලු පුරෝගෙන තැන තැන...
දරුණු යුද්ධයෙදි ඇතිවූ පෙර දින...
ඔයා ගිහිල්ලලු මා තනිකරලම...

පසුදින කිසිවක් සිදුනොවූ ගානට...
පොත් ටික අරගෙන ගියෙ පාසල වෙත...
යන මඟ දෙපසෙහි ගස් සෙවනෙහි හිඳ...
පෙම් බැඳි විරු සඳ නෑ දුටුවේ මම...

අදටත් ඔබ වෙනුවෙන් මේ හිත යට...
මහමෙරකට වැඩියෙන් ආලය ඇත...
එන්න එපා නැවතත් මේ සසරට...
විරු සෙබලානෙනී පතමි නිවන් සුව...

*තනු ඕ ගමිලත්, (ගීත රචිකා)*
*ගලගෙදර, මහනුවර*



## නිවාඩු නොමැතිව නොපැමිණීම

ප්‍රශ්න නොමැතිව ප්‍රශ්න කරගෙන
පිස්සු හැදෙන ජීවිතේ
මට්ටු වුණ එකම තැන
වෙට්ටු දාන්න බැරි ජීවිතේ
තිත්ත වෙන රස්සාව
හමුදාව මට සිතේ
ඇත්ත මට සිතේ
ඇත්ත මට කියාදෙන
හිතවතුන් හැම අතේ
පස්සෙ මට වැටහුනේ
මේක නොව ජීවිතේ...

*සෙ/379164 ලා/කෝ ගුණතිලක ඩීපීඡ්පී*
*14වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව*
*යුහ කඳවුර - ඔඩ්ඩුසුඩාන්*

## ප්‍රිය

කඳවුරේ
රෑ අඳුරේ
සිටිනා තුරේ
ඔබේ රුව මැවේ නිතරේ
සත්තයි සොඳුරේ
ඔබට මා ආදරේ...

*සෙ/380973 කෝප්‍රල් චතුර කුමාර පීපීඑන්*
*සුභ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය*

## බොර දියේ පිපි නෙලුම

ඔරු බඳට වාරු දී
බුදු පුදට මල් නෙළන
දෑත් සවි රන් මැණිකේ
කිරි වෙහෙර තනි රකින...

පිය සෙවණ අහිමි වූ
පවුල්බර උර දරන්
මවට කනවැල වෙමින්
පොඩි උන්ට මවක වූ...

සංසාරෙ ගිම් නිවන
පින් කඳම පල නොදී
අතු පැලක් උරුම වුව
නුඹ සැබෑ පිං කඳකි...

කරන පිං දෙගුණ වී
සුවිසාල මන්දිරේක
දෙවඟනක රූ අරන්
ඉපදේවි මතු භවයෙ...

*කපිතාන් දිල්හාරා දිසානායක - ජාශිබ*
*හමුදා ලේකම් කාර්යාලය*
*යුද්ධ හමුදා මූලස්ථානය*

## මවක් නොවූ මවක්

දරු සුරතල් බලා
නැති මුත් ඇය...
මවක් වී ඇත ඇය
අන් දරුවන්ට...
එරෙන්නේ නැත
දෙතනෙන් කිරි...
එනමුත් ඇය ආදරයෙන්
පොවයි මව් කිරි...
බර අඩු වී හැදී වැඩී
නැත දරුවා...
රෑ දහවල් වෙහෙස වී
සුවකර මවට පියාටම
භාර දී...
ඇය ලබනා සතුට
නිමක් නැත...

*එම් එල් සුචිත්‍රා*
*නොමේරූ ළදරු ඒකකය*
*යුද්ධ හමුදා රෝහල*
*නාරාහේන්පිට*

## ජාතිත් මා සැනහෙන්නම්

නුඹේ මතකයේ ඇත්තේ...
නුඹේ මතකයන් පමණයි...
මා තුළ සැනසීම ඇත්තේනම්...
ඒ තුළ විතරමයි...
සුන්දර වූ ඒ මතකයන් තුළින්...
ජාතිත් මා සැනසෙන්නෙමි...
ජාතිත් පතා ආ නොවුනත් නුඹ මාව...
සංසාර පුරාවටම මා...
පතා ආවෙමි නුඹවම...

*සෙ/කිව්104364 සාසෙ බංඩාර කේඑම්ඒච්*
*9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව*
*යුහ කඳවුර - පුදුකුඩිඉරිප්පු*

## සංචාරයක මතක සටහන්...

68 සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පසුගියදා 683 බළසේනා මූලස්ථානය හා ඒ යටතේ පාලනය වන ඒකකයන් හි නිරීක්ෂණ සංචාරයක නිරත විය. එහිදී එම අංශ, ආයතනවල රාජකාරී ස්වභාවය හා ඔවුන්ගේ පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ සේනාංකාධිපති එහි හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.






## නව වසරට අරුතක් දෙමින්...



2020 නව වර්ෂය උදාවත් සමග යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සේනාවිධායකගේ අධීක්ෂණය යටතේ වැඩසටහන් මාලාවක් දියත්කරන ලදී. රාජ්‍ය සේවා ප්‍රතිඥාව ප්‍රකාශයට පත් කිරීම, බෝධිපූජා පිංකමක් පැවැත්වීම, සේනාවිධායක විසින් හට පිරිස් ඇමතීම, රුක් රොපණ වැඩසටහන, සියලු නිල තේ පැන් සංග්‍රහය සහ ලූර්දුමාතා ක්‍රිස්තියානි දේවස්ථානයේ වැඩිහිටි නිවාසය වෙත දහවල් දානය පිරිනැමීම එම වැඩසටහන් අතර විශේෂ තැනක් ගන්නා ලදී.



---

## ඉගෙනුමට දිරියක්...





මන්නාරම 543 බළසේනාවට අයත් බළප්‍රදේශයේ තොරාගත් පාසල් 10 ක් වෙත හා අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් 112 දෙනෙකු වෙනුවෙන් වූ අධ්‍යාපනික සත්කාරයක් පසුගිය ජනවාරි 06 දින මන්/ශාන්ත ෆාතිමා මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැත්විණ. 54 සේමු සේනාංකාධිපති බ්‍රිගේඩියර් ඩීඑස්පී වැලිකල ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ මගපෙන්වීම යටතේ 543 බළසේනාවේ බළසේනාධිපති කර්නල් එම් මායාදුන්න ආර්එස්පී යූඑස්පී ගේ අදහසකට අනුව දියත් කළ මෙම මාහැඟි කටයුත්තේදී අදාළ පාසල් වෙත පාසල් උපකරණ ලබාදීමද සිසු දරුදැරියන් උදෙසා පාසල් උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය රුපියල් 1000.00 බැගින් වූ වව්චර් පත් පිරිනැමීමද සිදුකෙරිණ. කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන ප්‍රසාද් ලොකුපිටිය යන අය සහ ඔහුගේ මිතුරන් පිරිසක් විසින් මෙම මාහැඟි පරිත්‍යාග සඳහා අනුග්‍රාහක දායකත්වය සපයනු ලැබූහ.

## නිලධාරී සුහද හමුව - 2019...





යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන නිලධාරී සුහද හමුව 2019 දෙසැම්බර් 28 දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී විචිත්‍රවත් ලෙස පවත්වන ලදී. එම රෙජිමේන්තුවට අයත් සියලුම නිලධාරීන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පැවති එම සුහද හමුවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යාන්ත්‍රික පාබල රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඒඑම්ඒඑස්බී අතපත්තු සහ යාන්ත්‍රික පාබල කාන්තා සමාජයේ ගරු සභාපතිණිය ෆ්‍රෙඩ්රිකා අතපත්තු මහත්මිය සහභාගි වූහ.

මෙහිදී දරුවන් සහ පවුලේ සාමාජිකයන් හට සතුටුවීම සඳහා විනෝද ක්‍රීඩා රැසක්ද, සංගීත ප්‍රසංගයක්ද සංවිධානය කර තිබුණ අතර, 2019 වර්ෂයේ විවාහ ගිවිස ගත් නිලධාරීන් වෙත හා එම වර්ෂයේම විශ්‍රාමලත් ලුතිතන් කර්නල් කේඩීජ්කේ දයාරත්න ආර්එස්පී යූඑස්පී යන නිලධාරී හට සමරු තිළිණ ප්‍රදානයක්ද සිදුකරන ලදී. එසේම 2019 වර්ෂයේ ආරක්‍ෂක මාණ්ඩලික විද්‍යාලය - බටලන්ද වෙතින් පාඨමාලා හැදෑරීම සඳහා තේරී පත්වූ නිලධාරීන් හට ත්‍යාග පිරිනැමීමද එම සුහද හමුවේදී සිදුකෙරිණ.

## ඉගෙනුමට දිරියක් වෙමින්...



24 විජයබාහු පාබල රෙජිමේන්තුව සහ 5 යාන්ත්‍රික පාබල රෙජිමේන්තු මගින් සංවිධානය කරන ලද පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ජනවාරි 03 දින විනාසියෝඩෙ රජයේ දෙමළ මිශ්‍ර පාසල සහ ඥාණිමඩම් රජයේ දෙමළ මිශ්‍ර පාසලේදී පවත්වන ලදී. එහිදී එම පාසල්වල ඉගෙනුම ලබන 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන් 178 දෙනෙකු මෙම පාසල් උපකරණ හිමිකරගත්හ..

66 සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්බී විජේසුන්දර ආර්එස්පී ගේ මගපෙන්වීම මත 661 බළසේනාධිපති කර්නල් එච්එච්කේඑස්එස් හේවගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ අධීක්‍ෂණයෙන් යුතුව මෙම අධ්‍යාපනික සත්කාරය සිදුවිය.

## ශ්‍රී පාදස්ථානය වැඳපුදා ගනිමින්...


මෙවර ශ්‍රී පාදස්ථාන වන්දනා වාරය ඇරඹීමත් සමග එය වැඳපුදා ගැනීමට විශාල වශයෙන් පැමිණෙන සිවිල් වැසියන් ඉවතලන කැලිකසල හේතුවෙන් නල්ලතන්නිය මාර්ගය දැඩි පාරිසරික දූෂණයට ලක්වී ඇත. ඒ අනුව ආරක්‍ෂක සේනා මූලස්ථානය මධ්‍යම ආඥාපති මේජර් ජෙනරාල් ජීජේඑල් වඩුගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී වීඑස්වී එන්ඩියූ ගේ උපදෙස් මත ශ්‍රමදාන වැඩසටහනක් ඉකුත් ජනවාරි 23 දින පවත්වන ලදී. මෙම මාහැඟි කටයුත්ත සඳහා එම ආරක්‍ෂක සේනා මූලස්ථානය යටතේ ඇති සේනාංක, බළසේනාංක, ඒකක මෙන්ම පුහුණු පාසල් වෙතින් නිලධාරීන් සහ සෙසුනිලයින් දෙසීයකින් සමන්විත කණ්ඩායමක් සහභාගි වූහ.



# මගේ තාත්තේ...



එස්. ජී. දැහැන් චේතන වීරසිංහ
9 ශ්‍රේණිය "ඩී"
මහ/විද්‍යාර්ථ විද්‍යාලය, මහනුවර.



මගේ තාත්තාගෙ නම සැරයන් S.G. ධම්මික ලාල් වීරසිංහය. ඉතා දුෂ්කර ප්‍රදේශයක් වන දිඹාමඩුලු ප්‍රදේශයේ උපන් මගේ තාත්තා ගමේ දුෂ්කර පාසලකට ගොස් අධ්‍යාපනය ලබා ඉතා දුෂ්කර ජීවිතයක් ගතකර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳුණු බව මගේ මෑණියන්ගෙන් හා පවුලේ සියලු දෙනාගෙන්ම දැනගන්නට ලැබුණි. 1981 වර්ෂයේ 08 වැනි මස 14 වැනිදා උපන් මගේ තාත්තා 2006 වර්ෂයේ 08 වැනි මස 26 වැනි දින යාපනයේ මුහමාලේ ප්‍රදේශයේදී කුරිරු ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මෙලොවින් සමුගත්හ. එවකට මව කුසෙහි සිටි මට පිය සෙනෙහසවත් ලබා ගැනීමට නොහැකිවුණි.

මව් බිම වෙනුවෙන් දිවිහිමියෙන් සටන් කිරීමට වෙන කිසිවකු එඩිතර වන්නේ නැත. එය කිරීමට හැක්කේ ඔබ වැනි රණවිරුවකුටම පමණයි. එදා ඔබ තාත්තේ අපි සැවොම දමා ගියේ මේ මුළු රටම බේරා ගැනීමට සටන් කිරීමටයි. ඒ නිසා අද අපි නිදහසේ හුස්ම ගන්නවා. තාත්තේ ඔබ අපි උදෙසා ඔබේ හුස්ම පූජා කළා. යුධ අවිය අත දරාගෙන දුක් විඳිමින් මව් බිම බේරාගැනීමට සටන් කරන විට අම්මවයි, මාවයි නිතරම සිහිවුණා ඇති නමුත් ඔබ රාජකාරියට අකුරින්ම ඉටු කළ නිසා අද අපි නිදහසේ ජීවත් වෙනවා. ඔබත් කල් ඇරණෝදී සිහින දකින්නට ඇති ඔබේ පුතාත් රජෙක් කරන්නට. ඒ සිහින එලෙසින්ම සඵල කරගන්නා බව ඔබට මෙම ලිපියෙන් හරි මමත් පොරොන්දු වෙමි. තාත්තේ, ඔයා මේ ලොකේ කොතැනක හෝ සිට මා දෙස බලා සතුටු වන බව මම දනිමි. රට ජාතිය ආගම බේරා ගැනීම උදෙසා දිවිපිදූ මගේ තාත්තා අදත් මගේ ජීවිතයේ එකම වීරයාය.

---

# දෙස රැකුමට දිවිපිදූ ප්‍රථම රණවිරුවරිය



දශක තුනක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය හමුවේ මියගිය රණවිරුවන් පිළිබඳව අපි කොතෙකුත් අසා ඇත. ඔවුන්ගේ උත්තම මෙහෙවර පිළිබඳ අපි එලෙසින්ම ඇගයුම්ද ලබාදෙන්නෙමු. නමුත් යුද්ධය හමුවේ මියගිය රණවිරු දියණියන්ද සිටින බැව් වැඩි දෙනෙකු නොදනී. සෙබලුන් තරමටම එකී සෙබලියන්ද රණබිම තුළ එදවස ඉටුකළ අසමසම කාර්යභාරය සැමගේ ඇගයුමට බඳුන් විය යුත්තේ සැබැවින්ම ඔවුන් විහාර මහා කුළයේ ඉපදුනු දිරිය දියණියන්ම වූ නිසාය.

සෙ/58860 ආධුනික සෙබළ ඉරේෂා නිල්මිණී වර්ෂ 1994 දෙසැම්බර් 27 දින පළවෙනි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකායට අනුයුක්ත වූවාය. එතැන් පටන් සිය යුද්ධ හමුදා භූමිකාව ඇරඹි ඇය වර්ෂ 1995 මාර්තු 08 දින ලාන්ස් කෝප්‍රල් තනතුරට උසස්විය. 1997 ජනවාරි 01 දින වනවිට ඇය රාජකාරියෙහි නිතරව සිටියේ උතුරු ප්‍රදේශයේය. එහිදී ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා තවත් සෙබලියන් දෙදෙනෙකු සමඟ ඇය ට්‍රැක්ටරයකින් ගමන් කරමින් සිටියදී යාපනය තිරුනල්වේලි හිදී සැඟවීසිටි ත්‍රස්තවාදී පිරිසක් විසින් එල්ලකළ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකින් නොසිතු ලෙස සිය ජීවිතයෙන් සමුගත්තාය.

යුද බිම තුළ දිවි පිදූ අපමණ සෙබලුන් අතර, ප්‍රථම වරට රට වෙනුවෙන් ජීවිතය පූජාකළ සෙබළිය ලෙස එහිදී ඇය ඉතිහාස ගතවූවාය. 2020 ජනවාරි 02 දිනට ඇය දිවිපුදා වසර 23 ක් ගෙවුන මොහොතේ රණවිරුවා හි මෙම සටහන කෝප්‍රල් ඉරේෂා නිල්මිණී වූ එම වීර දියණියට උපහාර පිණිසය.



# Leadership Beyond Boundaries

Leadership is something that decides the success or failure of any organization. Subordinates under good leadership are happy and produce better results while weak leadership makes things go the other way around. It is said that regardless of what field it is, to be a leader is a privilege and a God-sent gift. If you have the opportunity to lead or manage people, you have been presented with the best gift to influence others. Using this opportunity wisely and effectively solely lies in your hands.

To positively impact on others or to inspire them for better outcome, you need to have certain indispensable leadership qualities which are different from the common and widely known traditional leadership traits that you often learn in books or generally known to everyone. Irrespective of how good you are as a leader having all the common leadership traits, if you inculcate the following attitudes/traits in you, it would definitely augment your values as a leader and you will command the respect of men and women under command to you. And you will be remembered as a successful leader in the hearts of your subordinates throughout their lives.

The first trait is, never mix up your official life or your official duties with your personal life. You must have a balanced approach to the functioning of both aspects. Although you consider yourself as a good and committed leader, your leadership abilities and reputation will be overshadowed, if you do not have an impeccable personal life. Your subordinates will have an extra respect towards you if your leadership abilities could blend with your quality personal life. You cannot forget your family and society because of your profession. You got to maintain equilibrium among your occupation, social life, and spiritual life based on your religion. It will help you to build a respectful image about you in the minds of your subordinates. All in all, your work life must compliment your family life - not complicate.

The workaholic attitude of certain leaders is another issue that often becomes a bane to their subordinates. Some leaders do not care about time management and tend to overstay in office for no apparent or justifiable reason. In some instances they even tend to schedule non-urgent work at weekends and public holidays, depriving them of having quality social/family lives. People should enjoy their personal or family life other than the official life. Unfortunately, workaholic and Machiavellianism attitudes of authoritative leaders mercilessly ruin the social and family lives of their subordinates. If you are high on Machiavellianism attitudes, you behave in such a way that will fulfill your needs without considering how you negatively impact on others. If you achieve your goals at the expenses others' wellbeing, you will not become a successful team player.

Instinct is another trait an effective leader should develop. He/she must be able to foresee things to plan better. You should be capable of identifying the blessings in disguise and vice versa. Sharp instinct of a leader no doubt would help him or her to understand the pulse of their subordinates and future unpleasant unfoldings. This trait will also give you an opportunity to resolve unwarranted future happenings that would bring discredit to your organization. More than that, it will help leaders to put a right man into the right job at the right time which is something largely missing in most organizations.

Flexible mindset is another trait. Some leaders do not like to deviate from the stipulated rules, circulations, regulations and age-old customs and practices in performing their duties. But the reality is, you cannot handle men and women in specific ways as you handle your household pets or animals. Remember, you can handle or maintain a machine or equipment in a specific way, but not humans. The fact that all you leaders must understand is your subordinates have a different mentality, requirements, impulse and backgrounds, and they are subjected to continuous change. You need to be flexible and sensible to identify them and their requirements to get the best out of them.

Some leaders are very serious and moody both on and off duty. It is true that you got to be serious as leaders. But it is important to be jovial and at times share lighter moments with your subordinates. Serious and moody leaders tend to get isolated and cannot be a good team player. He or she will not be able to read the pulse of others and they will not be fed with correct and sensitive information by subordinates. Be strict and firm, but share a joke or spend some cool time with your subordinates, appreciate their achievements and reward them. This will definitely improve team spirit and much needed cooperation to achieve the desired goals.

Other than the above qualities, if you can develop some counseling skills, anger and emotion management and practice your mind to change your approaches and focus with new concepts and innovations within your purview, you can be the leader of a happy and spirited team. Leadership is essentially an art. It is about promoting new ideas, it is about vision, passion, creativity and creating an environment where people can excel, it is about change, it is moving from the status quo, breaking all traditional boundaries.

Brigadier Keerthi Kottawattha
Deputy Commandant -
Sri Lanka Military Academy

## දහතුන් වසක අභිමන් සැමරුම...





2019 නොවැම්බර් මස 02 දිනට යෙදුණු 3 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායේ 13 වන සංවත්සරය ඒකක අණදෙන නිලධාරීගේ ප්‍රධානත්වයෙන් අභිමානවත්ව සමරණ ලදී. සියලු නිලයින්ගේ සාමූහික සහභාගීත්වයෙන් සිදුකෙරුණු එම සංවත්සර කටයුතු අතර අණදෙන නිලධාරී වෙනුවෙන් පැවති සම්මාන පෙළපාලිය හා සියලු නිල තේපැන් සංග්‍රහය ප්‍රධාන තැනක් ගන්නා ලදී.

## දිරිය දරුවන්ට අත්වැලක්...





55 සේනාංක මූලස්ථාන බළ ප්‍රදේශයට අයත් කඩෙයිකාඩු ආර්සීටීඑම් විද්‍යාලයේ දරු දැරියන් 320 දෙනෙකු වෙත පාසල් උපකරණ බෙදාදීමේ උත්සවයක් ඉකුත් ජනවාරි 06 දින එහි සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑන්එස් කොටුවේගොඩ අයිජී ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි. මෙම සත්කාරය සඳහා දානපති සුරේන් රාගවන් ද සිල්වා යන අය විසින් අනුග්‍රාහක දායකත්වය ලබාදී තිබුණි.

## ලේ දන්දීමේ වැඩසටහනක්....



ඉකුත් ජනවාරි 23 දිනට යෙදුනු 15(සෙව්) ගජබා රෙජිමේන්තුවේ 23 වන සංවත්සරය අභිමානවත්ව සමරන ලදී. එහිදී යුද බිමේ සහ විවිධ හේතූන් මත මියගිය රණවිරුවන් හා ඔවුන්ගේ ළගම ඥාතීන් වෙත පිං අනුමෝදන් කිරීම වස් යාපනය ශික්ෂණ රෝහලෙහි වෛද්‍ය කණ්ඩායමකගේ සහය ඇතිව ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම විශේෂ විය.

## සංවත්සර දින සමරමින්...



13 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව සිය 27 වන සංවත්සරය ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඩීඑම්එස් දිසානායක යූඑස්පී සීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2019 නොවැම්බර් 15 දින අභිමානවත් අයුරින් සමරන ලදී. එහිදී අණදෙන නිලධාරී වෙත සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පිරිනැමීම, රුක් රෝපණය, මියගිය රණවිරුවන් වෙත පුෂ්පෝපහාර පිදීම, සියලු නිල තේ පැන් සංග්‍රහය හා දිවා භෝජන සංග්‍රහය, ආගමික වතාවත් සංවත්සර දින වැඩසටහන් අතරට එක්ව තිබිණ. තවද සෙබලුන්ගේ සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වූ වොලිබෝල් හා ක්‍රිකට් තරගාවලියද සංගීත ප්‍රසංගයද සංවත්සර දින පැවති සෙසු විශේෂ අංග විය.

# උපන්දින සුබපැතුම්....



දෙවන වියට පා තබන
**නිලිෂ් දීගායු රාජපක්ෂ පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/12එච්01085 කෝප්‍රල් රාජපක්ෂ ජේසීඑස් )



හයවන වියට පා තබන
**ඒජී රවිඳු අනුහස් පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/15ජී1440 ලා/කෝ ලලිත් කුමාර ඒජී )



පළමුවන වියට පා තබන
**නෙයාෂි අකේෂා හේරත් දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/413441 බනි I එම්ජීපීකේ ජයලත් යූඑස්පී)



හත්වන වියට පා තබන
**බී.ඩී. චනුකි ආශින්සනා දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/බනි I බීඩීආර් වසන්ත කුමාර යූඑස්පී)



දෙවන වියට පා තබන

**ඩීඑම් තිසුම් නේතුම්සා දසනායක දියණියට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/678913 කෝප්‍රල් බණ්ඩාර ඩීඑම්ඩී)



පළමු වියට පා තබන

**සසිඳු හංසක වැලිවිට පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/244911 කෝප්‍රල් වැලිවිට ඩබ්ලිව්එම්එස්කේ)



පළමුවන වියට පා තබන
**චාරුක නිමිනද ආකර්ශ පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/379717 ලා/කෝ සුමේධ ජීජී)



පළමුවන වියට පා තබන
**එස්. ජේ. අදිස් ඉදුවර පුතුට**

සුබ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා හා තාත්තා ඇතුලු පවුලේ සැම (සෙ/248823 ලා/කෝ ජයසිරි පීඑස්)

## මනෝවිද්‍යාත්මක මෙහෙයුම් පාඨමාලා අංක - 24 [සෙසුනිල]



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් සංවිධානය කෙරුණු මනෝවිද්‍යාත්මක මෙහෙයුම් පාඨමාලා අංක 24 සෙසුනිල, ඉකුත් ජනවාරි මස 07 සිට 27 දක්වා පනාගොඩ කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා උපදේශකයින්, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ආගමික පූජකවරුන්ගේ දේශන සහයෙන් පැවැත්වූ මෙම පාඨමාලාවට දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් හමුදා සාමාජිකයෝ 39 දෙනෙකු සහභාගි වූහ. පාඨමාලාවේ අවසන් දේශනය සහ සහතිපත් ප්‍රදානය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් සිදුකරනු ලැබීය.

VISION

# English

VISION SPECTRUM

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යයනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රීසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## Could you please

යම්කිසි කාර්යයක් කිරීමට "ඔබට පුලුවන්ද" යන අර්ථය හඟවමින් කුමක් හෝ කාර්යයක් ඉතා විනීතව කරල දෙන්න පුලුවන්ද යනුවෙන් ඉල්ලීමක් කිරීම සඳහා මෙම වාක්‍ය රටාව භාවිතා වේ.

***Fomular*** - සූත්‍රය

**Could you please + verb (Infinitive) + Object + Rest**
කුඩ් යූ ප්ලීස් + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
ඔබට පුලුවන්ද + ක්‍රියා පදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

***Ex*** / උදා :-

1. Could you please open the door?
   කුඩ් යූ ප්ලීස් ඕපන් ද ඩෝ?
   ඔබට පුලුවන්ද කරුණාකර දොර අරින්න?
2. Could you please sing a song.
   කුඩ් යූ ප්ලීස් සින්ග් අ සෝන්ග්?
   ඔබට පුලුවන්ද සින්දුවක් කියන්න?
3. Could you please help me to pass the tese?
   කුඩ් යූ ප්ලීස් හෙල්ප් මී ටු පාස් ද ටෙස්ට්?
   ඔබට පුලුවන්ද කරුණාකරල මට විභාගය සමත් වෙන්න උදව් කරන්න?
4. Could you please give some water
   කුඩ් යූ ප්ලීස් ගිව් සම් වෝටර්.
   ඔබට පුලුවන්ද කරුණාකරල වතුර ටිකක් දෙන්න?

***Nota Bene*** / සැ:යු :-

ඉහත වාක්‍යයන්හි අර්ථය හා භාවිතයන් පිළිබඳ සැලකීමේදී අවදානය යොමුකළ යුතු කරුණු පහත පෙන්වා දී ඇති පරිදි අධ්‍යයනය කරන්න.

- **Could you please:** "ඔබට පුලුවන්ද" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම ඛණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.
- ***Verb:-*** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදී ***(Infinitive)*** ක්‍රියා මූල පදයක් ලෙස භාවිතා කළ යුතුය.
- ***Object :-*** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ. නම් එය ඉතිරි ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.
- ***Rest :-*** ඉතිරි වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

Analysis of the sentence formation - වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශනය.

Could you + verb (Infinitive) + Object + Rest.
කුඩ් යූ + වර්බ් (ඉන්ෆිනිටිව්) + ඔබ්ජෙකට් + රෙස්ට්.


ඔබට පුලුවන්ද + ක්‍රියාපදයේ මූලික ස්වරූපය + කර්මය + ඉතිරිය.

Could you open the door please?
කුඩ් යූ ඕපන් ද ඩෝ ප්ලීස්?
ඔබට පුලුවන්ද කරුණාකර දොර අරින්න?

***English vision*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.



කපිතාන් චමින්ද ලියනගේ
ශ්‍රීලයුපොදුසේබ
සංඥා පුහුණු පාසල - බූවැලිකඩ
**www.englishvision.lk**





## සද්දෙ නං හොඳයි...

නිවසට පැමිණි පෙම්වතා සමග තරුණියක් සාලයේ සිට කතාබස් කරමින් විහිලු තහලු කරමින් උන්නාය... ඇගේ මව වරක් දෙවරක් ඇතුලු කාමරයක සිට පැමිණ සාලයට කර පොවා බැලුවාය...



**දුව** - ඇයි අම්මෙ... අපේ සද්දෙ වැඩිද?

**අම්මා** - නෑ... නෑ... ළමයිනේ සද්දෙන් මට ඇති කරදරයක් නෑ... මේ සද්දෙ හිටිගමන් නවතින එක තමා කරදරේ...



## අලි ඔළුව...

විදේශ සංචාරයක නිරත වූ ඇලන් තමා නැවතී සිටි හෝටලයේ එල්ලා තිබූ විවිධ සතුන්ගේ ඔළු දෙසා බලා ඒ ගැන හෝටලයේ අයිතිකරුගෙන් විමසන්නට විය.

**ඇලන්** - මේ අලි ඔළුව නම් හරිම දැකුම්කළුයි...

**හෝටල් අයිතිකරු** - ඕකා තමයි අපෙ තාත්තව මැරුවෙ...

**ඇලන්** - ආ ඔයාගෙ තාත්ත අප්‍රිකාවෙ සංචාරය කළාද?

**හෝටල් අයිතිකරු** - නෑ නෑ තාත්ත දවසක් ඔය ඔළුව හයි කරල තියෙන තැනට පහළින් පුටුවක වාඩිවෙලා හිටියෙ...

## හම්බ කිරීම...

**ජයන්ත** - ඔයා දන්නවද වසන්ති මම අවුරුදු හයේදීත් සංගීතය නිසා සල්ලි හම්බ කරල තියෙනව...

**වසන්ති** - ඇත්තටම පුදුමයි... කොහොමද එච්චර පුංචි කලෙදිම සංගීත සංදර්ශනවලට ගියාද?

**ජයන්ත** - නෑ නෑ ඒ දවස්වල බටනලාව වාදනය නොකර ඉන්නවට අල්ලපු ගෙදර හිටපු අංකල් මට සල්ලි දුන්න...

## හොරකම...

**විනිසුරු** - මේ රෙදි හොරකම කරද්දි තමන්ගෙ අහිංසක බිරිඳවයි දුවල දෙන්නවයි මතක් උනේ නැද්ද?

**විත්තිකරු** - අනේ ස්වාමිනී... මට මතක් උනා... නොවුන නෙමයි... ඒත් ඒ සාප්පුවෙ තිබුණෙ පිරිමි ඇඳුම් විතරයි...



## අපාය...

**දුව** - අම්මා... මම කැමති නැහැ කමල් එක්ක විවාහ වෙන්න එයා කියනව අපාය කියල එකක් නැහැල්ලු...

**අම්මා** - ඒ ගැන කරදර වෙන්න ඕන නෑ... බැඳල මාසෙන් එයාට තේරුම් යයි එහෙම තැනක් තියෙන බව...





ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල්
පීආර් වනිගසූරිය
වීඑස්වී යූඑස්පී එන්ඩියූ
යූඑස්ඒසීජීඑස්සී**

2020 ජනවාරි මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



14 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්
ඒඑස් ආරියසිංහ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
යූඑස්පී එන්ඩියූ**

2020 ජනවාරි මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



68 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්
ආර්එම්පීජේ රත්නායක
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
යූඑස්පී**

2020 ජනවාරි මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



53 සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**බ්‍රිගේඩියර්
එච්එච්ඒඑස්පීකේ සේනාරත්න
ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

2019 දෙසැම්බර් මස 29 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



පර්යේෂණ, විශ්ලේෂණ, යෝජනා හා සංවර්ධන ශාඛාවේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්
එන්පී අකුරන්තිලක**

2020 ජනවාරි මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්
එස්එම්එස්පීබී සමරකෝන්
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2019 දෙසැම්බර් මස 30 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් පාලන/හකාස ලෙස

**බ්‍රිගේඩියර්
එම්අයිපී නානායක්කාරවසම්**

2020 ජනවාරි මස 02 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක ලෙස

**බ්‍රිගේඩියර්
එස්පීඒඅයිඑම්බී සමරකෝන්
එච්ඩීඑම්සී එල්එස්සී**

2020 ජනවාරි මස 13 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



කලමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්
ඩීවීපී කාරියවසම් ආර්එස්පී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



කමාන්ඩෝ බළසේනා මූලස්ථානයේ බළසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්
පීජීපීඑස් රත්නායක
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2020 ජනවාරි මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



රණවිරු සෙවන යුද්ධ හමුදා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්
අයිඑච්එම්ටීඑච් සේනාරත්න
යූඑස්පී**

2019 දෙසැම්බර් මස 23 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



141 බළසේනාවේ බළසේනාධිපති ලෙස

**කර්නල්
සී එස් මුණසිංහ
ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී පීඑස්සී
අයිජී**

2020 ජනවාරි මස 06 දින සුබ මොහොතින් රාජකාරී ආරම්භ කළ අයුරු



573 බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**කේඩබ්ලිව්එස් පෙරේරා**
**ආර්ඩබ්ලිව්පී**

2020 ජනවාරි මස 03 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



511 බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්**
**ටීඑම්ආර්බී රත්නායක**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

2019 දෙසැම්බර් මස 23 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



විධායක ජෙනරාල් ශාඛාවේ
කර්නල් විධායක ජෙනරාල්
ලෙස

**කර්නල්**
**එම්පීඑන්ව් මුතුමාල යූඑස්පී**
**පීඑස්සී**

2019 දෙසැම්බර් මස 20 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) ජ්‍යෙෂ්ඨ කර්නල්
සම්බන්ධීකරණ නිලධාරී
ලෙස

**කර්නල්**
**සිසිර කුමාර ආර්එස්පී**

2020 ජනවාරි මස 06 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
(කිලිනොච්චිය)
කර්නල් සම්බන්ධීකරණ ලෙස

**කර්නල්**
**එම්ඩීබීඑම්එස් ජයමාන්න**

2020 ජනවාරි මස 11 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ශ්‍රී ලංකා රයිෆල් බළකායේ
අණදෙන නිලධාරී ලෙස

**කර්නල්**
**ආර්එම්එච් ජයතිස්ස**

2020 ජනවාරි මස 03 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) කර්නල්
පාලන/හකාස ලෙස

**ලුතිතන් කර්නල්**
**බීආර්ව් ජයරත්න යූඑස්පී**

2020 ජනවාරි මස 01 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



ඉදිරි නඩත්තු පෙදෙස
(කිලිනොච්චිය) මානි 1
(පාලන/හකාස) ලෙස

**ලුතිතන් කර්නල්**
**වයිසීඩීපී පියසේන**

2019 නොවැම්බර් මස 26 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



2(සෙව්) ශ්‍රී ලංකා යුද්ධ
හමුදා පොදුසේවා බළකායේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල් සීඑස් දේමුණි**

2020 ජනවාරි මස 23 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



3 වන රෙජිමේන්තුව
විශේෂ බළකායේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ජේඩීබී ජයවීර ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී පීඑස්සී**

2019 දෙසැම්බර් මස 23 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



23 විජයබාහු පාබල
රෙජිමේන්තුවේ අණදෙන
නිලධාරී ලෙස

**මේජර්**
**ඒබීඑස් අතුකෝරල**
**ආර්ඩබ්ලිව්පී**

2019 නොවැම්බර් මස 04 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු



3 ශ්‍රී ලංකා යුද්ධ හමුදා
යුධෝපකරණ බළකායේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඩබ්ලිව්එස්ඩී ප්‍රනාන්දු ඒටීම්**

2020 ජනවාරි මස 02 දින
සුබ මොහොතින් රාජකාරී
ආරම්භ කළ අයුරු

# මත්ද්‍රව්‍ය මැඩලීම සබැඳි දේශනයක්....





යුද්ධ හමුදා සාමාජිකයින් මත්ද්‍රව්‍ය භාවිතයට හා ඒ සම්බන්ධ වැරදිවලට යොමුවීම වැළැක්වීම මෙන්ම මත්ද්‍රව්‍යවලින් සිදුවන අනිසි විපාක පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම උදෙසා වූ දේශනයක් ඉකුත් ජනවාරි 29 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. එම දේශනය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ හිටපු සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දියනාත් සමරසිංහ, මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ පුබුදු සුමනසේකර යන මහත්වරු විසින් මෙහෙයවන ලද අතර, ඊට නිලධාරීන් 44 ක් සහ සෙසුනිලයින් 322 ක් සහභාගි වූහ. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන මගින් අදියර පහක් යටතේ යුද්ධ හමුදා මූලස්ථානයේ රාජකාරී නියුතු භට පිරිස් දැනුවත් කිරීම අපේක්ෂිතය.


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 සැරයන් සේනාරත්න ජීසී - 3 ඉසේරෙ

සෙ/753797 ලාන්ස් කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම් - 11 ඉසේරෙ

සෙ/754676 ඉසෙ ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 4051445

011 2993076

**යුහ දිගුව**

51445/51446

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය






**අධීක්ෂණය**

මේජර් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල් එස්ජේ කාරියකරවන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී - විපාරෙ



**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**

කපිතාන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



**සෝදුපත් කියවීම**

කපිතාන් ඩීඑම් දිල්හාරා සජීවනී - ජාශිබ









# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පිහිණුම් හා ජල ක්‍රීඩා ශූරතාවලිය...

යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පිහිණුම් සහ ජල ක්‍රීඩා ශූරතාවලිය - 2019 අවසන් තරඟ සහ ත්‍යාග ප්‍රදානෝත්සවය ඉකුත් ජනවාරි 29 දින පනාගොඩ යුද්ධ හමුදා ජනපද පිහිණුම් තටාකයේදී පැවැත්විණ. එම අවස්ථාවට වැඩබලන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්විය. කාණ්ඩ 04 ක් යටතේ පැවැත්වූ මෙම තරඟාවලියට රෙජමේන්තු 15 ක සහ බළඇණි 03 ක පිහිණුම් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 246 ක් සහභාගි වූහ.

එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකා කණ්ඩායම් රන් පදක්කම් 44 ක් දිනාගැනීමට සමත් වූහ. තවද විවෘත පිහිණුම් ශූරතාවලිය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරුවන් (SLEME) දිනාගත් අතර, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකා (SLAC) කණ්ඩායම ආධුනික ශූරයින් බවට පත්වූහ. එමෙන්ම (පිරිමි) ආධුනික ජල ක්‍රීඩා ශූරතාවලිය ගජබා රෙජිමේන්තුව සතුකරගත් අතර විවෘත ජල ක්‍රීඩා ශූරතාවලිය ශ්‍රී ලංකා ඉංජිනේරු බළකා ක්‍රීඩකයින් විසින් දිනාගන්නා ලදී. අන්තර් රෙජිමේන්තු ආධුනික කාන්තා ශූරතාවලිය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ පිහිණුම් ක්‍රීඩිකාවන් විසින් දිනාගත් අතර විවෘත කාන්තා පිහිණුම් ශූරතාව 1 වන ශ්‍රී ලංකා කාන්තා බළකායට හිමිවිය. හොඳම ආධුනික කාන්තා පිහිනුම් ක්‍රීඩිකාව ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකායේ කාන්තා සෙබළ එල්. රාජකරුණා විසින් දිනාගත් අතර, හොඳම ආධුනික පිරිමි පිහිණුම් ක්‍රීඩකයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකායේ සාමාන්‍ය සෙබළ එම්. කුමාර හිමිකර ගත්තේය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා ජලක්‍රීඩා කමිටු සභාපති මේජර් ජෙනරාල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර ඇතුලු ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.

රණවිරුවා

# එළිපිට මුහුණු බැඳ සැඟවී තැටීම




මේ රටට සාමය හා නිදහස උදාකරදීම වෙනුවෙන් බෝම්බ වෙඩි උණ්ඩවලට විතරක් නෙමෙයි සතුරන්ගේ ගෑස් ප්‍රහාරවලට මුහුණ දෙන්නත් අපේ රණවිරුවන්ට සිදුවුනා. යුද්දෙ දරුණුවට තිබ්බ කාලෙ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් හමුදාවලට එරෙහිව රසායනික ගෑස් ප්‍රහාර පවා එල්ල කළා. පරාජය පෙනී පෙනී හිටපු ඔවුන් ඒ විදියට ජාත්‍යන්තර යුද නීති පවා උල්ලංඝණය කරද්දි ගෑස් මුහුණු ආවරණ පැළඳගෙන අපේ රණවිරුවො ඒ අභියෝග වලටත් නොසැලී මුහුණ දුන්නා. ඒ අසීරු අවදානම් අවස්ථා ජය ගන්න අපේ හමුදා ක්‍රියාකළ ආකාරය ගැන ඊට සම්බන්ධ වූවන් හැරෙන්න වැඩි දෙනෙක් දන්නෙ නැහැ. කොහොම වුනත් ගලන ගඟ ඉනි බැඳල නවත්තන්න බෑ වගේ අපේ හමුදාවේ ජයග්‍රාහී ගමන ඒ කිසි දේකින් වළක්වන්න බැරි වුනා.

"හැංගිලා මුහුණු බැන්දත් නටන්න වෙන්නෙ එළියෙ" කියලා කියමනක් තියෙනවා. නමුත් එළිපිට මුහුණු බැඳලා හැංගිලා සටන් වැදුණු අපේ රණවිරුවො ඒ අතීත කියමනට නව අරුතක් එක් කළා.





මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.